# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2008 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්

පිටුව


1. 2008 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත ........................................................................ I

2. 2008 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත........................................................................ I

3. 2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත..................... II

4. 2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත......................................... IV

5. 2008 අංක 12 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත..... VI

6. 2008 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත .................................. VII

7. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත ..................................................... XII

8. 2008 අංක 42 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත............. XXII

## 2008 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

**2004 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

1. මේ පනත 2008 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2004 අංක 11 දරන මුදල් පනතේ II වන කොටස (සෙලියුලර් ජංගම දුරකථන ග්‍රාහක බද්ද පැනවීම) ඒ කොටසේ "ජංගම දුරකථන" යන වචන යෙදී ඇති සෑම තැනක ම ඒ වෙනුවට "ජංගම දුරකථන හෝ රැහැන් රහිත ස්ථාවර දුරකථන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2008 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

**2005 අංක 5 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2008 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2005 අංක 5 දරන මුදල් පනතේ I වන කොටසේ (සමාජ වගකීම් බද්ද පැනවීම) 2 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) සියයට 1 අනුප්‍රමාණයකට 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2007 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා ද;

(ඇ) සියයට 1.5 අනුප්‍රමාණයකට 2008 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාල සීමාවේ සිට සහ ඉන්පසු"; සහ

(2) එම වගන්තියේ දෙවන අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේම තවදුරටත් ආදායම් බද්ද මත අයවිය යුතු සමාජ වගකීම් බද්ද :—

(අ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ, මේ පනතේ මේ කොටසේ නියමයන් ප්‍රකාර, 2006 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වී 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 0.25 ක අනුප්‍රමාණයකට ගණනය කොට අය කළ යුතු ය;

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ, මේ පනතේ මේ කොටසේ නියමයන් ප්‍රකාර"

(i) 2006 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වී 2008 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 1.0 ක අනුප්‍රමාණයකට ; සහ

(ii) 2008 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන ඕනෑම කාලසීමාවක් සඳහා සියයට 1.5ක අනුප්‍රමාණයකට,

ගණනය කොට අය කළ යුතු ය.''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

"මේ කොටස සඳහා අර්ථ නිරූපනය. 6අ. මෙම කොටසේ කාර්ය සඳහා —

"සමාගම" යන්නට, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ඒ වචනයට දී ඇති අර්ථයම තිබිය යුතුය.''.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ 5 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"5. ( XVI, XVII සහ XXI පරිච්ඡේදවල සහ 36 වන හා 65 වන වගන්තිවල විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, ඒ පනත 2006 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භව 2008 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා ආදාළ වනතාක් දුරට ;

6. ( XVI වන, XVII වන සහ XXI වන පරිච්ඡේදවල සහ 36 වන වගන්තියේ සිට 65 වන වගන්ති දක්වා වගන්තිවල විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, ඒ පනත යම් සමාගමකට සහ 2008 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන කාල සීමාවට ආදාළ වනතාක් දුරට.".

5. (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියට, මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 2008 ජනවාරි මස 1 වන දිනයේ දී ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියට, මේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් කරන ලද සංශෝධනය සහ පළමුවන උපලේඛනයට මේ පනතේ 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනය 2008 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. (1) මේ පනත 2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2008 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1) එහි (ඇ) ඡේදයේ "ණය කාඩ්පත දරන්නා විසින්; සහ" යන වචන වෙනුවට "ණය කාඩ්පත දරන්නා විසින්"; යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇ) ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන අධිකාරි පත්‍රයක් සම්බන්ධයෙන්, නොතාරිස් ධුරය සඳහා ඉල්ලුම් කරන තැනැත්තා විසින්;

(ඇඇඇ) බලපත්‍රයක් සම්බන්ධයෙන් එම බලපත්‍රය ඉල්ලුම් කරන තැනැත්තා විසින්; සහ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"මුද්දර ගාස්තු ගෙවිය යුතු ආකාරය

8. (1) 7 වන වගන්තිය ප්‍රකාර මුද්දර ගාස්තු සමථයකට පත්කර ඇති අවස්ථාවක හැර, නිශ්චිතව සඳහන් යම් සාධන පත්‍රයක් සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව එම සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට පෙර හෝ ලියා අත්සන් කරන අවස්ථාවේ දී හෝ නියම කර ඇති වටිනාකමින් යුත් ඇලවිය හැකි මුද්දර ඇලවීමෙන් ගෙවනු ලැබිය යුතු ය. ගෙවන ලද මුද්දර ගාස්තුව එසේ ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය මත නිශ්චිතව දැක්විය යුතුය :

එසේ වුව ද, ශ්‍රී ලංකාවේ ලියා අත්සන් කරනු ලබන කොටස් පැවරීම් සඳහා, එසේ ලියා අත්සන් කිරීමේ දින සිට එක් මාසයක් ඇතුළත එම මුද්දර ගාස්තුව ගෙවනු ලැබිය යුතු ය.

(2) යම් නිශ්චල දේපළක් උකස් කිරීමකට හෝ බදු දීමකට අදාළ යම් නිශ්චිතව සඳහන් සාධන පත්‍රයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව එම නිශ්චිතව සඳහන් සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට පෙර හෝ ලියා අත්සන් කරන අවස්ථාවේ දී හෝ නියමිත බැංකුවකට ගෙවිය හැකි ය. කෙසේ වුවද මුද්දර ගාස්තුව ගෙවිය යුතු තැනැත්තාගේ පාලනයට යටත් නොවන හේතුවක් නිසා, එසේ මුද්දර ගාස්තුව ගෙවීමට නොහැකිව ඇති අවස්ථාවක, සාධන පත්‍රය ලියා අත්සන් කිරීමේ දින සිට දින හතක් ඇතුළත මුද්දර ගාස්තුව නියමිත බැංකුවට ගෙවිය යුතු ය. එම බැංකුව විසින් ඉන්පසු එම මුද්දර ගාස්තුව නිසි පරිදි ගෙවූ බවට දැක්වෙන නියමිත ආකෘතියෙහි වූ සහතිකයක් නිකුත් කළ යුතු අතර, එම සහතිකය අදාළ සාධන පත්‍රයෙහි අලවනු ලැබිය යුතු ය.

(3) යම් නිශ්චිතව සඳහන් සාධන පත්‍රයක් ලියා අත්සන් කරන ලද තැනැත්තකු එසේ ලියා අත්සන් කරන අවස්ථාවේ දී එම නිශ්චිතව සඳහන් සාධන පත්‍රය මත ලස් තැබූ මුද්දරයක් මගින් මුද්‍රා තබා නොමැති අවස්ථාවක එම මුද්දර නැවත පාවිච්චි කිරීම වැළැක්වීම සඳහා සෑම මුද්දරයක් මත හෝ හරහා ම තම නම තීන්තෙන් ලිවීමෙන් හෝ කෙටි අත්සන් යෙදීමෙන් එම මුද්දර අවලංගු කරනු ලැබිය යුතු ය. තව ද එම නිශ්චිතව සඳහන් සාධන පත්‍රය රුපියල් පනහක හෝ ඊට වැඩි වටිනාකමකින් යුතු ඇලවෙන මුද්දරයක් අලවා ඇති සාධන පත්‍රයක් වන විට එම මුද්දර කැපීමෙන් හෝ සුදුසු උපකරණයකින් විදීමෙන් සිදුරු කර, නිශ්චිතව සඳහන් සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තා විසින් අවලංගු කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි අවලංගු කර නොමැති ඇලවිය හැකි මුද්දරයක් අලවා ඇති සාධන පත්‍රයක් එම මුද්දරයේ වටිනාකමෙහි ප්‍රමාණයට මුද්දර අලවා නොමැති සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ආර්ථික සේවා ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය." යන වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:

"ආර්ථික සේවා ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය ‍:

එසේ වුව ද, මේ පනතේ සහ මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් ද්‍රව්‍ය හෝ භාණ්ඩ අපනයනය කිරීමෙන් පැන නගින පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තුවේ අනුප්‍රමාණය සියයට 0.25 නොඉක්මවිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය." යන වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, 2004 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ විධිවිධාන වලට අනුව ගෙවන ලදුව, එකී පනතේ විධිවිධාන අනුව 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු වූ අදාළ ආදායම් බද්දෙන් අඩුකිරීමෙන් පසු යම් ආර්ථික සේවා ගාස්තු ප්‍රමාණයක් 2006 මාර්තු මස 31 වන දිනට ඉතිරිව ඇති විට —

(අ) ඒ ප්‍රමාණයේ, 2005 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂය සඳහා ගෙවූ යම් ආර්ථික සේවා ගාස්තු කොටසක් ඇතුළත් වේ නම්, ඒ කොටස 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂ තුනෙහි එක් එක් තක්සේරු වර්ෂයට ; හෝ

(ආ) ඒ ප්‍රමාණයේ, 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂය සඳහා ගෙවූ යම් ආර්ථික සේවා ගාස්තු කොටසක් ඇතුළත් වේ නම්, ඒ කොටස 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙහි එක් එක් තක්සේරු වර්ෂයට,

විභජනය කළ හැකි අතර, එසේ විභජනය කරන ලද ආර්ථික සේවා ගාස්තුවේ කොටස් එකී එක් එක් තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) උපලේඛනයේ 4 වන සහ 5 වන අයිතම වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් :—

"(4) (i) දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 28 වන අයිතමය හැර ඒ උප ලේඛනයේ සඳහන් යම් අනුප්‍රමාණයකට අනුව, ලාභ හා ආදායම මත ආදායම් බදු අය කළ හැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්;

සියයට 0.5

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායක් විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ පස්වන

උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණවලට සමාන අනුප්‍රමාණවලට අනුව ඒ ව්‍යවසායේ ලාභ හා ආදායම මත බදු අයකල හැකි කාලසීමාව තුළ අදාළ පිරිවැටුම වන, 2008 අප්‍රේල් මස 1වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

සියයට 0.5

4අ. (i) දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 24 වන අයිතමය සහ 28 වන අයිතම හැර ඒ උපලේඛනයේ සඳහන් යම් අනුප්‍රමාණයකට අනුව, ලාභ හා ආදායම් මත ආදායම් බදු අය කළ හැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව පැන නගින ආදාළ වන පිරිවැටුමේ යම් කොටසක්;

සියයට 0.5

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායක් විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණවලට සමාන අනුප්‍රමාණවලට අනුව ඒ ව්‍යවසායේ ලාභ හා ආදායම මත බදු අයකළ හැකි කාලසීමාව තුළ අදාළ පිරිවැටුම වන, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

සියයට 0.5

5. වෙළෙන්දකු විසින් නිෂ්පාදනය නොකරන ලද මෝටර් වාහන හෝ මත්පැන්, තොග හෝ සිල්ලර වශයෙන් (බෙදාහරින්නකු නොවන) යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක නිරතවීමෙන් ලැබෙන පිටුවැටුමේ ඇතුළත් වන පරිදි

(i) 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

සියයට 0.5

(ii) 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

සියයට 1.0

(2) උපලේඛනයේ 11 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් :

"11. (i) යම් අපනයනකරුවකු විසින් ඇඟලුම් අපනයන කිරීමෙන් හෝ ඇඟලුම් අපනයනකරුවන්ට අපනයනය කරන ඇඟලුම් නිෂ්පාදනය කිරීමට භාවිත කිරීම සඳහා දේශීය වශයෙන් නිෂ්පාදිත රෙදි සැපයීමෙන් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්

සියයට 0.1

(ii) ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් වෙළෙඳ ආයතනයක් ඇඟලුම් අපනයනය කිරීමෙහි නියැලී සිටිනතාක් දුරට එම වෙළෙඳ ආයතනයේ පිරිවැටුමේ ඇතුළත් වන පරිදි 2008 අප්‍රේල් මස 1වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

සියයට 0.1

11අ. (i) (අ) ඇඟලුම් අපනයනය කිරීමෙන්; හෝ

(ආ) අපනයනය කිරීම සඳහා යම් ඇඟලුම් නිෂ්පාදනය කරන අපනයනකරුවකුට දේශීය වශයෙන් නිෂ්පාදිත ඇඟලුම් සැපයීමෙන්;

(ඇ) යම් ඇඟලුම් අපනයනකරුවකුට අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කිරීමට දේශීයව නිෂ්පාදිත රෙදි පිළි සැපයීමෙන්,

ලැබෙන පිරිවැටුමේ;

(ii) ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් වෙළෙඳ ආයතනයක් ඇඟලුම් අපනයනය කිරීමෙහි නියැලී සිටිනතාක් දුරට එම වෙළෙඳ ආයතනයේ පිරිවැටුමේ,

ඇතුළත් වන පරිදි 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

සියයට 0.1

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2008 අංක 12 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

**2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

1. (1) මේ පනත 2008 අංක 12 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2008 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. 2007 අංක 47 දරන පනත මගින් සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනතේ 2 වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද පැනවීම

2. (1) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට යටත් වන මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේත අංකය යටතේ දැක්වෙන ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දැක්වෙන සිලින්ඩර් ධාරිතාවක්, ආසන ධාරිතාවක් හෝ බර සහිත යම් මෝටර් වාහනයක් මත, එම මෝටර් වාහනය ආනයනය කරන අවස්ථාවේ දී (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ '(ඉ)' උපලේඛනය ප්‍රකාර නිශ්චය කරනු ලබන, එම මෝටර් වාහනයේ රේගු වටිනාකම හා ඒ මත අය කරනු ලබන සියලු බදු, ගාස්තු හා අයකිරීම් වලින් සංයුක්ත වන සම්පූර්ණ වටිනාකම මත ඒ උපලේඛනයේ III වන තීරයේ දක්වා ඇති අනුප්‍රමාණයක ප්‍රමාණයට ගණන් බලනු ලබන (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවා, ආනයනය කරනු ලබන අවස්ථාවේ දී අය කරගනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "මෝටර් වාහනය" යන යෙදුමට ත්‍රී රෝද රථයක් ඇතුළත් නොවිය යුතු ය." .

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය එකතු කිරීමෙන්, ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"උපලේඛනය

| අංකය | *I* වන තීරය<br>සං. ව. සංකේතය | *II* වන තීරය<br>සිලින්ඩර් ධාරිතාව/<br>ආසන ධාරිතාව/<br>බර | *III* වන තීරය<br>අනුප්‍රමාණය |
|---|---|---|---|
| 1. | 8703 | සිලින්ඩර් ධාරිතාව 1600 ට නොවැඩි මෝටර් වාහනයක් | සියයට 5.0 |
| 2. | 8703 | සිලින්ඩර් ධාරිතාව 1600 ට වැඩි නමුත් 2000 ට නොවැඩි මෝටර් වාහනයක් | සියයට 7.5 |
| 3. | 8703 | සිලින්ඩර් ධාරිතාව 2000 ට වැඩි මෝටර් වාහනයක් | සියයට 10 |
| 4. | 8702 | ආසන ධාරිතාව තැනැත්තන් 13 ට වඩා අඩු මෝටර් වාහනයක් | සියයට 10 |
| 5. | 8702 | ආසන ධාරිතාව තැනැත්තන් 13 ක් හෝ ඊට වැඩි නමුත් තැනැත්තන් 17 ට වඩා අඩු මෝටර් වාහනයක් | සියයට 5.0 |
| 6. | 8702 | ආසන ධාරිතාව තැනැත්තන් 17 ක් හෝ ඊට වැඩි මෝටර් වාහනයක් | සියයට 7.5 |
| 7. | 8704 | මෝටර් වාහනයක් (නිශ්චිතව සඳහන් බරක් සහිත) | සියයට 5.0" |

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2008 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

### 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

1. මේ පනත 2008 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දෙවන අතුරු විධානය එහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) ශ්‍රී ලංකාවට තාවකාලිකව ආනයනය කරනු ලබන :—

(i) යම් සංවර්ධන ව්‍යාපෘතියක ප්‍රයෝජනයට ගැනීම සඳහා වන ඉහළ වටිනාකමක් ඇති පිරියත, යන්ත්‍ර සූත්‍ර හෝ උපකරණ වන ; හෝ

(ii) ප්‍රදර්ශන භාණ්ඩ ලෙස හෝ යම් තාක්ෂණික නිරූපණයක් සඳහා යොදා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගන්නා භාණ්ඩ වන,

එම ව්‍යාපෘතිය, ප්‍රදර්ශනය හෝ තාක්ෂණික නිරූපණය සම්පූර්ණ වීමෙන් පසු නැවත අපනයනය කරන යම් භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, එම ව්‍යාපෘතියේ, ප්‍රදර්ශනයේ හෝ නිරූපණයේ දිනය දක්වා වන කාලසීමාව සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව,".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (6) වන වගන්තියේ (iv) වන අනු ඡේදය සහ ඉන් ඉක්බිතිව ඒ උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන සහ ඉලක්කම් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(iv) අවස්ථාවෝචිත පරිදි, (iii) වන ඡේදයේ සඳහන් කර ඇති බදු ඉන්වොයිස් පත්‍රය මත හෝ රේගු භාණ්ඩ ප්‍රකාශනය මත යෙදවුම් බද්ද, එකී මාස දොළහක කාල සීමාව ඇතුළත එම බදු අය කළ හැකි කාල සීමාව සඳහා වූ වාර්තාව ඉදිරිපත් කිරීමෙන්, ඒ බදු ඉන්වොයිස් පත්‍රයේ හෝ රේගු භාණ්ඩ ප්‍රකාශනයේ දිනයේ සිට මාස දොළහක් ඉකුත් වන දින හෝ ඊට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාල සීමාවක නිමැවුම් බද්දෙන්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි අඩුකර නොමැති නම් :

එසේ වුව ද, (2) වන උපවගන්තියේ විධිවිධාන වල සහ මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) අනු-ඡේදයේ (I) වන අයිතමයේ සහ (ii) වන අයිතමයේ නිදහස් කිරීම්වල කුමක් සඳහන්ව තිබුන ද, අදාළ බදු මුදල් ගෙවීම රජය විසින් දරනු ලබන ඉහත කී අයිතමවල සඳහන් කර ඇති ආකාරයේ යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට හෝ යම් විශේෂ ව්‍යාපෘතියකට භාණ්ඩ හෝ සේවා සැපයීමට අදාළ සේවා සපයන ලියාපදිංචි ඕනෑම තැනැත්තකුහට එම ව්‍යාපෘතිවලට භාණ්ඩ හෝ සේවා සැපයීමට සම්බන්ධ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම මත යෙදවුම් බදු සඳහා ඉඩදිය හැකිය.".

(2) ඒ වගන්තියේ (10) වන උපවගන්තියේ, අතුරු විධානයේ අවසානයට පහත සඳහන් අයිතමය එකතු කිරීමෙන් :—

"එසේම තවදුරටත්, මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) අනු-ඡේදයේ (i) වන අයිතමයේ සහ (ii) වන අයිතමයේ නිශ්චිතව සඳහන් යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට හෝ වෙනත් යම් විශේෂ ව්‍යාපෘතියකට භාණ්ඩ හෝ සේවා සපයන යම් තැනැත්තකුට මේ උපවගන්තිය අනුව ඉඩ දියහැකි යෙදවුම් බදු නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා, ඒ ව්‍යාපෘතියේ අදාළ වන කාල සීමාව සඳහා සැපයුම්කරුවකු විසින් සිදු කරන ලද සැපයුම්වල වටිනාකම ගණනය කරන ලද නිමැවුම් බද්ද මත බදු අයකළ හැකි සැපයුමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ii) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ii) යම් තැනැත්තකු විසින් 2003 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව, නමුත් 2007 දෙසැම්බර් මස 31 වන දිනට පෙර ක්‍රියාත්මක වන පරිදි ; සහ

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සමිතියක් නොවන යම් තැනැත්තකු විසින් 2008 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, ක්‍රියාත්මක වන පරිදි,".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "කල්බදු බඩු තොග වන්නා වූ ඒ තැනැත්තාගේ යම් වත්කම්" යන වචන වෙනුවට "ඉහත කී පනතේ විධිවිධාන යටතේ කල්බදුකරණය කරන ලද වත්කමක්," යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය හෝ පාඩුව පදනම් කරගෙන ඒ ආයතනයේ අගය එකතුවීම ගණනය කළයුතු බව සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 25උා වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි වූ සෑම තැනැත්තකුටම හෝ හවුල් ව්‍යාපාරයකටම අදාළ කාර්තුව අවසන් වීමෙන් ඉක්බිතිව ම එළඹෙන මාසයේ විසි වන දිනයට පසු නොවන දිනයක දී, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියෙහි වූ සහ තොරතුරු ඇතුළත් වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ ගෙවීම තුළ ඇතුළත් බදු මුදලින් තුනෙන් එකක් අඩු කරනු ලැබිය යුතුය." යන වචන වෙනුවට "එකතු කළ අගය මත බදු අත්තිකාරම් ලෙස, ඒ ගෙවීම තුළ ඇතුළත් බදු මුදලින් තුනෙන් එකක් අඩු කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"එකතු කළ අගය මත බදු අත්තිකාරම් අඩු කිරීම"

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පැහැර හැර ඇති බද්ද අයකර ගැනීම සඳහා කාල සීමාව

48අ. 37 වන වගන්තිය යටතේ අයකර ගන්නා හෝ ලබාගන්නා බද්දක් තක්සේරු කිරීම අවසානාත්මක හා තීරණාත්මක බවට පත් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක අවසානයේ සිට මාස තුනක කාලයක් සම්පූර්ණ වීමේ දින සිට වසර පහක් ඉකුත් වී ඇති අවස්ථාවක, පැහැර හරින ලද බදු අය කර ගැනීම සඳහා, මේ පනතේ 42වන, 43 වන, 44 වන, හෝ 48 වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කිසිදු නීති කෘත්‍යයක් ආරම්භ නොකළ යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ කොටසේ (අ) ඡේදයේ"

(අ) (iv) වන අයිතමය ඉවත් කර පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"(iv) ගුවන්යානා, හෙලිකොප්ටර්, මුතු, දියමන්ති ස්වභාවික හෝ කෘතිම මැණික් හෝ බාල මැණික්, දියමන්ති කුඩු, අගනා ලෝහ, අගනා ලෝහ ආලේපිත ලෝහ, රන් කාසි (2007.07.17 දින සිට බලාත්මක වන පරිදි) ;";

(ආ) (xii) වන අයිතමය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(xii) 2008 දෙසැම්බර් මස 31 වන දිනට වඩා පසු නොවී ආනයනය කරන, ඉදිකිරීම් කර්මාන්තය සඳහා ප්‍රයෝජනයට ගන්නා යන්ත්‍ර සූත්‍ර, කිරි පිරිසැකසුම් යන්ත්‍ර, පරිඝනක උපාංග ඇතුළුව පරිඝනක, රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ විස්තරය හා කේතන ක්‍රමවේද අංක යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනාගනු ලැබූ පේෂකර්මාන්තය සඳහා භාවිත කරනු ලබන යන්ත්‍ර සූත්‍ර, පේෂ කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන තුල් සහ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන සායම් (2008 01. 01 දින සිට බලාත්මක වන පරිදි) හා සහල් සැකසීමේ කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන යන්ත්‍ර සූත්‍ර (2005.12.23 දින සිට බලාත්මක වන පරිදි) ;";

(2) ඒ කොටසේ (ආ) ඡේදයේ —

(අ) (i) (අ) අයිතමයේ "ආයතනයක් විසින් අධ්‍යාපන සේවා සැපයීම" යන වචන වෙනුවට "(2006.01.01 දින සිට බලාත්මක වන පරිදි) අධ්‍යාපන ආයතනයක් විසින් අධ්‍යාපන සේවා සැපයීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (xii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"(xii) සෞඛ්‍යාරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ වෘත්තීය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සියලු සෞඛ්‍යාරක්ෂක සේවා සැපයීම (2007.07.01 දින සිට බලාත්මක වන පරිදි) ;"

(ඇ) (xxi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන් :—

"(xxii) (2007.07.01 දින සිට බලාත්මක වන පරිදි) මැටි උළු හෝ (2007.07.17 දින සිට බලාත්මක වන පරිදි) රසායනික නැප්තා එම මැටි උළු හෝ රසායනික නැප්තා, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණයට;

(xxiii) 2007.07.01 දින හෝ එදිනට පසුව එකතු කළ අගය මත බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නොගෙවන ලද හෝ එම දෙපාර්තමේන්තුව මගින් එකතු නොකරන ලද, කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක හෝ මත්ස්‍ය නිෂ්පාදන වල දේශීය සැපයුම ඇතුළුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන පිරිසැකසුම් නොකළ කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක හෝ මත්ස්‍ය නිෂ්පාදන ;

(xxiv) 2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව එකතු කළ අගය මත බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නොගෙවන ලද හෝ ඒ දෙපාර්තමේන්තුව මගින් එකතු නොකරන ලද පිරිසැකසුම් නොකළ ඉස්සන් දේශීය සැපයුම ඇතුළුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සකස් නොකළ ඉස්සන් (2008.01.01 දින සිට බලාත්මක වන පරිදි);

(xxv) ආනයනික වේවැල් (2007.07.01 දින සිට බලාත්මක වන පරිදි ) ;

(xxvi) දේශීයව නිෂ්පාදිත නැවුම් කිරිවලින් නිපදවන ලද දේශීයව නිෂ්පාදනය කරන ලද කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සහල්වලින් දේශීයව නිෂ්පාදනය කරන ලද සහල් නිෂ්පාදන (2008.01.01 දින සිට බලාත්මක වන පරිදි ) ; සහ

(xxvii)දේශීයව නිෂ්පාදිත සීනි (2008.01.01 දින සිට බලාත්මක වන පරිදි ).".

(3) ඒ කොටසේ (ඇ) ඡේදයේ (xviii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන් :—

"(xix) (අ) යම් ව්‍යාපෘතියක් සඳහා භාවිත කිරීම සඳහා ඉහළ වටිනාකමක් ඇති පිරියත, යන්ත්‍රසූත්‍ර හෝ අනෙකුත් උපකරණ ආනයනය කිරීම ; හෝ

(ආ) ප්‍රදර්ශන භාණ්ඩ ලෙස හෝ යම් තාක්ෂණික නිරූපනයක් සඳහා භාවිත කිරීම සඳහා වන භාණ්ඩ ආනයනය කිරීම,

2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (ආ) ඡේදය ප්‍රකාර අය විය යුතු බද්ද ගෙවීම විලම්භනය කරනු ලැබ ඇතිවිට සහ අවස්ථාවෝචිත පරිදි එම ව්‍යාපෘතිය, ප්‍රදර්ශනය හෝ නිරූපණය සම්පූර්ණවීමෙන් පසු ප්‍රති අපනයනය කරනු ලබන විට (2007.07.17 දින සිට බලාත්මක වන පරිදි) ;

(xx) රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් සංයෝජිත වර්ගීකරණ විස්තරය සහ කේතන ක්‍රමවේද අංක යටතේ හඳුනා ගත් ගුවන්යානා එන්ජින් සහ ගුවන්යානා අමතර කොටස් ආනයනය කිරීම (2007.07.17 දින සිට බලාත්මක වන පරිදි) ;

(xxi) සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 1401.20 යටතේ වන වේවැල් ආනයනය කිරීම (2007.07.01 දින සිට බලාත්මක වන පරිදි) ;

(xxii) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 24ඇ වගන්තිය යටතේ බදු විරාමයකට සුදුසුකම් ලබන ව්‍යවසායයක් මගින්, එම ව්‍යවසායයේ නිෂ්පාදනය කිරීමේ හෝ සේවා සැපයීමේ කාර්යය සඳහා භාවිත කිරීම සඳහා වන පිරියත සහ යන්ත්‍රසූත්‍ර ආනයනය කිරීම (2008.01.01 දින සිට බලාත්මක වන පරිදි).".

(xxiii) මුදල් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව (ඊ) ඡේදයේ සඳහන් යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා වූ භාණ්ඩ ආනයනය කිරීම)";

(4) ඒ කොටසේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) (i) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වන වගන්තිය ප්‍රකාරව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත් ඕනෑම ව්‍යාපෘතියක් සඳහා වන භාණ්ඩ හෝ සේවා (2008. 01. 01 දින සිට බලාත්මකවන පරිදි) ; හෝ

(ii) රටට සැලසෙන ආර්ථික යහපත සලකා මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් හඳුනා ගනු ලබන රජය විසින් ඒ ව්‍යාපෘතියේ බදු ගෙවීම දැරිය යුතු යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා වන භාණ්ඩ හෝ සේවා 2008. 01. 01 දින සිට බලාත්මකවන පරිදි) ; හෝ

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනජීත යටතේ ලියාපදිංචි වී ඇති යම් සමුපකාර සමිතියක් මගින් භාණ්ඩ හෝ සේවා, (2008. 01. 01 දින සිට බලාත්මකවන පරිදි), සැපයීම .".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන උපලේඛනය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

**"තුන්වන උපලේඛනය**
**මූලික අනුප්‍රමාණය**

(අ) පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම හෝ ආනයනය :—

(i) සීනි, 2007 දෙසැම්බර් මස 31 වන දින දක්වා ;

(ii) පරිප්පු ;

(iii) අර්තාපල්, 2007 ජුනි මස 30 වන දින දක්වා ;

(iv) ළූනු, 2007 ජුනි මස 30 වන දින දක්වා ;

(v) කරවල ;

(vi) මිරිස් ;

(vii) රේගු කාර්යය සඳහා සංයෝජිත වර්ගීකරන විස්තරය සහ කේතන ක්‍රමවේද අංක යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනාගත් උසස් තාක්ෂණයෙන් යුත් වෛද්‍ය උපකරණ හෝ ටිකට් නිකුත් කිරීමේ යන්ත්‍ර නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා භාවිත කරනු ලබන යම් යන්ත්‍ර;

(viii) ස්වර්ණාභරණ ;

[මේ උපලේඛනයේ (i) වන සහ (ii) වන අයිතමවල සඳහන් භාණ්ඩ ආනයනය කිරීම හෝ සැපයීම 2004 ඔක්තෝබර් මස 1 වන දින සිට 2004 නොවැම්බර් මස 18 වන දින දක්වා, සියලු කාර්ය සඳහා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් ලෙස සැලකිය යුතු ය.]

(ආ) පහත සඳහන් ද්‍රව්‍ය ආනයනය :—

(i) රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරන විස්තරය හා කේතන ක්‍රමවේද අංක යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයාගේ අනුමතය ඇතිව, හඳුනාගත් සිනමා පට, විකසනය කර ප්‍රදර්ශණය කරන ලද චිත්‍රපට, චුම්භක සිනමා ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍ර, චිත්‍රපට කැමරා හා ප්‍රක්ෂේපන යන්ත්‍ර කොටස් හා උපාංග, චිත්‍රපට රසායනාගාර සඳහා අවශ්‍ය මෙවලම් සහ උපකරණ, විද්‍යුත් සූත්‍රිකා හෝ විසර්ජන ලාම්පු සහ චාප පහන් කාබන් ;

(ii) සීනි (2008.01.01 වන දින සිට බලාත්මක වන පරිදි) ;

(iii) ටින් කළ මාළු, පරිප්පු, මුංඇට (2007.06.05 වන දින සිට බලාත්මක වන පරිදි) ;

(iv) අර්තාපල් (2007.07.01 වන දින සිට බලාත්මක වන පරිදි) ;

(v) ළූනු (2007.07.01 දින සිට බලාත්මක වන පරිදි).".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ—

(1) 2 වන වගන්තියේ (3) වන උපවගන්තියට මේ පනතේ 2 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, සියලු කාර්ය සඳහා 2007 ජූලි මස 17 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

(2) 22 වන වගන්තියේ (6) වන උපවගන්තියට සහ (10) වන උපවගන්තියට මේ පනතේ 3 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, සියලු කාර්ය සඳහා 2008 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(3) 25උඉ වගන්තියට මේ පනතේ 6 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, [අළුත් (4) වන උපවගන්තිය එකතු කිරීම] සියලු කාර්ය සඳහා 2007 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(4) 26අ වගන්තියේ (1) වන උපවගන්තියට මේ පනතේ 7 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, සියලු කාර්ය සඳහා 2008 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(5) 48අ වගන්තියට මේ පනතේ 8 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, [එම වගන්තිය ප්‍රතියෝජනය කිරීම] සියළු කාර්ය සඳහා 2006 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

12. 2007 ජූලි මස 1 වන දිනයෙන් ආරම්භව, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා මේ පනතේ විධිවිධාන සලසා තිබෙන පරිදි එකතු කළ අගය මත බදු එකතු කරන යම් තැනැත්තකු නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති ලෙසත් එම එකතු කිරීම වලංගු ලෙස සිදු කර ඇති බව හා කරනු ලබන ලෙසත් සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කිරීම හා සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩු පැවරීම්වලින් ඒ තැනැත්තන් මුක්ත කරනු ලැබිය යුතු ය.

13. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත

[සහතිකය සටහන් කළේ 2008 දෙසැම්බර් මස 01 වන දින]

**1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද සංවර්ධන බැංකුවල වත්කම්, වගකීම්, ගිවිසුම්, සේවා නියුක්තිකයන් යනාදිය අන්තර්ග්‍රහනය කිරීමට සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා ද ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

1. මේ පනත 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන),ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන බැංකුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) බැංකුව, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු ය. එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව නඩු පැවරීමට ද නඩු පවරනු ලැබීමට ද හැකියාව ඇත්තේ ය.

3. (1) බැංකුවේ මුද්‍රාව සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් නිලධරයකුගේ හෝ භාරයේ තිබිය යුතු ය.

(2) බැංකුවේ මුද්‍රාව මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) බැංකුවේ මුද්‍රාව මණ්ඩලයේ අධ්‍යක්ෂවරු දෙදෙනකු හෝ මණ්ඩලයේ එක් අධ්‍යක්ෂවරයකු සහ ප්‍රධාන විධායක නිලධරයා (බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා ලෙස නම් කරනු ලැබ ඇති) ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර සහ දෙදෙනාම තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයට සාක්ෂියක් වශයෙන් අත්සන් කරනු ලැබිය යුතු ය.

4. බැංකුවේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටුවනු ලැබිය යුතු ය.

5. 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත ප්‍රකාරව පිහිටුවා ඇති මේ පනතේ 42 වන වගන්තිය ප්‍රකාර බැංකුව වෙත සතු කර ඇති සංවර්ධන බැංකු කාර්යාලය දැනට තිබෙන ස්ථාන ද ඇතුළත් ව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන ස්ථානවල බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ශාඛා පිහිටුවා පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

## I වන කොටස
## බැංකුවේ බලතල සහ අරමුණු

6. ප්‍රධාන වශයෙන් සූක්ෂම මූල්‍ය ආයතන සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා මූල්‍යමය සහායලබා දෙමින් සංවර්ධනය, කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳ, වාණිජ, පශු සම්පත් සහ කාන්තා අභිවෘද්ධිය, ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත කලාපීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම බැංකුවේ අරමුණු වේ.

7. සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් රජයේ ප්‍රමුඛතා සැලකිල්ලට ගෙන, යම් ප්‍රමුඛතා අංශයකට වෙන් කරනු ලැබීම සඳහා නියමිත ණය දීමේ ප්‍රතිශතය ගැසට්පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

8. මේ පනතේ විධිවිධානවලට යටත්ව සහ යම් නීතියක් මගින් හෝ යටතේ පවරා ඇති ස්වකීය බලතලවලට අගතියක් නොමැතිව 1988 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව යම් අවසරලත් විශේෂිත බැංකුවක් විසින් පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දී ඇති සියලු හෝ යම් ක්‍රියාකාරකමක් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

## II වන කොටස
## බැංකුවේ කළමණාකාරිත්වය

9. (1) බැංකුවේ කටයුතු සහ ව්‍යාපාර කටයුතුවල කළමනාකරණය සහ පරිපාලනය (මෙහි මින් මතු “මණ්ඩලය” යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය.

(2) මණ්ඩලය විසින්, බැංකුවේ අරමුණුවලට අදාළව මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ බැංකුවේ සියලු බලතල හෝ බලතල කිසිවක් ක්‍රියාත්මක කළ හැකි අතර සහ අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ හෝ එකී වෙනත් යම් නීතියක් යටතේ බැංකුව විසින් සිදු කිරීමට සහ ඉටු කිරීමට බලයලත් සියලු ක්‍රියා සහ දේ ඉටු කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ස්ථාවර ව්‍යාපාර ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියා කළ යුතු අතර, රජයේ ආර්ථික සංවර්ධන වැඩසටහන්වලට නිසි සැලකිල්ල ලබා දෙමින් කටයුතු කරනු ලැබිය යුතු ය.

10. මණ්ඩලය, මේ පනතේ 11 වන වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට අවස්ථාවෝචිත පරිදි නම් කරන ලද හෝ තෝරා පත් කර ගනු ලැබූ හත්දෙනකුට නොඅඩු සහ එකොළොස් දෙනකුට නොවැඩි අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවකනේ සමන්විත විය යුතු ය.

11. (1) අධ්‍යක්ෂ මණ්ඩලයට පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන් සිටිය යුතු ය :—

(අ) භාණ්ඩාගාර ලේකම් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයකු ;

(ආ) ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන ලංකා බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු ;

(ඇ) මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු;

(ඈ) ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු.

(2) බැංකු, ගිණුම්, මූල්‍ය, නීතිය, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, සමූපකාර කටයුතු, ග්‍රාමීය සංවර්ධන හෝ කාන්තා අභිවෘද්ධිය යන ක්ෂේත්‍රවල අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් දරන්නා වූ තැනැත්තන් අතරින් භාණ්ඩාගාර ලේකම්වරයා විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු “නම් කළ අධ්‍යක්ෂවරුන්”

යනුවෙන් හඳුන්වනු ලබන) තුන්දෙනකුට නොඅඩු සහ හත්දෙනකුට නොවැඩි නම් කළ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක්, අමාත්‍යවරයා විසින් එසේ නම් කිරීමේ දී, හැකිතාක් දුරට කාන්තා නියෝජනය සපුරාලීමට උනන්දු විය යුතු ය.

(3) නම් කළ අධ්‍යක්ෂවරයකු අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

(4) මේ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු නොලැබූ අධ්‍යක්ෂවරයකු වන්නා වූ නම් කළ අධ්‍යක්ෂ වරයකු අවුරුදු තුනක කාලයක් සඳහා දෙවන වරට නැවත පත් කරනු ලැබිය හැකි ය.

(5) යම් නම් කළ අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීමට හේතු දක්වා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් යම් නම් කළ අධ්‍යක්ෂවරයකු තම ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(7) රෝගාතුරවීම නිසා හෝ වෙනත් යම් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර සිටීම නිසා ස්වකීය ධුරයෙහි කර්තව්‍ය ඉටු කිරීමට යම් නම් කළ අධ්‍යක්ෂවරයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(8) මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා යම් නම් කළ අධ්‍යක්ෂවරයකු ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, එකී හිස් කරන ලද ධුරය නියෝජනය කරන්නා වූ ආයතනය නියෝජනය කිරීම සඳහා (2) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය යුතු ය. එකී නම් කළ අධ්‍යක්ෂවරයා විසින් තමා අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂවරයාගේ ඉතිරි ධුරකාලය සඳහා ධුර දැරිය යුතු ය.

12. (1) අමාත්‍යවරයා විසින්, නම් කළ අධ්‍යක්ෂවරයන් අතරින් මණ්ඩලයේ සාමාජිකයකු සභාපති වශයෙන් පත් කර ගනු ලැබිය යුතු ය.

(2) රෝගාතුර වීම, අශක්නුතාවයකට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් සභාපතිවරයා තාවකාලිකව සිය ධුරයේ කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් අධ්‍යක්ෂවරයකු මණ්ඩලය විසින් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) තත්කාර්ය සඳහා හේතු දක්වා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා අමතනු ලබන ලිපියක් මගින් සභාපතිවරයා විසින් සිය ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(5) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, සභාපතිවරයාගේ ධුර කාලය අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

13. බැංකුව මගින් සහාය විය යුතු ජාතික වැදගත්කමක් ඇති නිශ්චිත ක්ෂේත්‍රයන්හි සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් බැංකුවට විශේෂ දැනුමක් ලබා ගැනීම අවශ්‍ය අවස්ථාවල දී, සභාපතිවරයාට උපදෙස් දීම සඳහා නම් කළ අධ්‍යක්ෂවරුන් අතරින් මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස මණ්ඩලයේ සාමාජිකයන් විමසා සභාපතිවරයා විසින් අනුයුක්ත කරනු ලැබිය යුතු ය.

14. අදාළ රජයේ චක්‍රලේඛනවලට අනුකූලව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි පාරිශ්‍රමික බැංකුවේ අරමුදල්වලින් අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

15. බැංකුව විසින් ඇතුළත් වීමට යෝජිත යම් ගිවිසුමක් විෂයෙහි සෘජුව හෝ වක්‍රානුකූලව සම්බන්ධතාවයක් දක්වන්නා වූ අධ්‍යක්ෂවරයකු විසින් ඒ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී හෙළිදරව් කරනු ලැබිය යුතු ය. එම හෙළිදරව් කිරීම මණ්ඩලයේ සටහන්වල වාර්තාගත කළ යුතු ය. එකී ගිවිසුම හා සම්බන්ධ ඉන් පසු මණ්ඩලයේ කිසිම සාකච්ඡාවකට හෝ තීරණයකට එම අධ්‍යක්ෂවරයා සහභාගී නොවිය යුතු ය.

16. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටින මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන සභාපතිවරයා විසින් දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම්, පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින් පැමිණ සිටින එක් අධ්‍යක්ෂවරයකු එකී රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරුන්ගේ මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය නිලබලයෙන් පත් වන අධ්‍යක්ෂවරුන් සහ නම් කළ අධ්‍යක්ෂවරුන් ඇතුළුව —

(අ) අධ්‍යක්ෂවරුන්ගේ පූර්ණ සංඛ්‍යාව අධ්‍යක්ෂවරුන් හතක් වන විට, අධ්‍යක්ෂවරුන් පහක් ද

(ආ) අධ්‍යක්ෂවරුන්ගේ පූර්ණ සංඛ්‍යාව අධ්‍යක්ෂවරුන් හතකට වැඩි වන්නා වූ විට, අධ්‍යක්ෂවරුන් හයක් ද, විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දරනු ලබන තැනැත්තාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සම්බන්ධයෙන් සහ එකී රැස්වීම්වල කටයුතු පිළිබඳව කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

17. යම් අධ්‍යක්ෂවරයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම හෝ අධ්‍යක්ෂවරයකු පත් කිරීමේ හෝ තෝරා පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම කටයුත්තක් හෝ ක්‍රියාවක් බල රහිත නොවිය යුතු ය.

18. (1) මණ්ඩලය විසින් ස්වකීය බලතල හෝ කාර්යය කලින් කළ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කාර්යයක් පවරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, ඒ සෑම තැනැත්තකු විසින්ම මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව එසේ තමා වෙත පවරන ලද ඒ බලය හෝ කාර්යය ක්‍රියාත්මක කරනු හෝ සිදු කරනු ලැබිය හැකිය; නැතහොත් ඉටු කරනු ලැබිය හැකි ය. තව ද එසේ පවරා ඇති බලය හෝ කාර්යය මණ්ඩලය විසින් කවර හෝ වේලාවක ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකිය; නැතහොත් ඉල්ලා අස් කර ගත හැකි ය.

19. බැංකුවේ පූර්ණකාලීන නිලධරයකු මණ්ඩලය විසින් ලේකම්වරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

## III වන කොටස
## **මුදල්**

20. (1) 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත ප්‍රකාරව පිහිටුවා ඇති සහ පනතේ 42 වන වගන්තිය ප්‍රකාරව බැංකුව සතු කරනු ලැබ ඇති ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට රජය, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් දෙනු ලැබූ දායක මුදල්වලින් සමන්විත මුදල් බැංකුවේ ප්‍රාග්ධනය විය යුතු ය.

(2) රජය, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව එකී දායක මුදල් ප්‍රකාරව බැංකුවේ කොටස් හිමියන් විය යුතු අතර, එකී පිළිවෙලින් සඳහන් දායක මුදල්වල අනු ප්‍රමාණ අනුව රජය, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට, බැංකුවේ කොටස් වෙන් කර දීම සිදු කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කොටස් හිමියන් විසින්, බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනයට මෙහි නිශ්චිතව සඳහන් දායක මුදල්වලට අමතරව තම කැමැත්ත අනුව බැංකුවට තවදුරටත් ප්‍රාග්ධනය දායක කරනු ලැබීම හෝ බැංකුවේ කොටස් මිළදී ගැනීම හෝ කරනු ලැබිය හැකි ය.

21. බැංකුවේ කොටස් හිමියන් විසින්, මණ්ඩලය අනුමත කරනු ලැබිය හැකි ආකාරයට ඔවුනොවුන් අතර පමණක් කොටස් පැවරීම කරනු ලැබිය හැකි ය.

22. 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත ප්‍රකාර පිහිටුවන ලද සහ පනතේ 42 වන වගන්තිය යටතේ බැංකුව සතු කරනු ලැබ ඇති සංවර්ධන බැංකුවේ පොදු සංචිත අරමුදල සමන්විත වන්නා වූ සියළු මුදල් වලින් බැංකුවේ පොදු සංචිත අරමුදල සකස් විය යුතු අතර, මණ්ඩලය විසින් වාර්ෂික ලාභ වලින් සියයට විස්සක් එම පොදු සංචිත අරමුදලට බැර කරනු ලැබිය හැකි ය.

23. (1) 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත ප්‍රකාර පිහිටුවා ඇති සහ පනතේ 42 වන වගන්තිය යටතේ බැංකුව සතු කරනු ලැබ ඇති සංවර්ධන බැංකුවේ විශේෂ සංචිත අරමුදල සමන්විත වන්නාවූ සියලු මුදල් වලින් බැංකුවේ විශේෂ සංචිත අරමුදල සකස් විය යුතු අතර, මණ්ඩලය විසින් බැංකුවේ බොල් සහ අවදානම් ණය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සෑම වසරකම වාර්ෂික ලාභයෙන් සියයට පහක් එම විශේෂ සංචිත අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වීමට පෙරාතුව යම් සංවර්ධන බැංකුවක සේවා නියුක්තයන්ට සුබසාධක පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය බවට හඳුනා ගත් සියලු මුදල් බැර කරනු ලැබිය යුතු "සුභසාධන ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන වෙන් වූ ගිණුමක් පිහිටුවනු ලැබිය යුතු ය. එම ගිණුමට බැර කරනු ලබන මුදල් නියම කරනු ලබන ආකාරයට ප්‍රයෝජනයට ගනු ලැබිය යුතු ය.

**24.** මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වූ වාර්ෂික ලාභවලින් යම් ප්‍රතිශතයක් කොටස් හිමියන්ගේ ලාභාංශ ගෙවීමේ කාර්ය සඳහා බැංකුව විසින් පාවිච්චි කරනු ලැබිය යුතු ය.

**25.** බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන සෑම ණය මුදලක්ම මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් යම් නියම සහ කොන්දේසි සහ ඇප මත ප්‍රදානය කළ යුතු ය.

## IV වන කොටස
## **කාර්ය මණ්ඩලය**

**26.** (1) මණ්ඩලය විසින්, සාමාන්‍යාධිකාරිවරයා ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර දහයක පළපුරුද්දක් ඇත්තා වූ තැනැත්තකු පත් කර ගනු ලැබිය යුතු අතර, එම තැනැත්තා" –

(අ) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සහිත පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් දරන්නකු විය යුතු ය ; හෝ

(ආ) බැංකු හෝ වෙනත් යම් අදාළ ක්ෂේත්‍රයක වෘත්තීය සුදුසුකම් සහිත තැනැත්තකු විය යුතු ය ;
සහ
තවද, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(2) සාමාන්‍යාධිකාරිවරයා බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, මණ්ඩලයේ සාමාන්‍ය විධානය, අධීක්ෂණය සහ පාලනයට යටත්ව බැංකුවේ කටයුතු පවත්වාගෙන යෑම, කළමනාකරණය සහ පරිපාලනය කරනු ලැබිය යුතු අතර, බැංකුවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවට සහාය දැක්වීම කරනු ලැබිය යුතු ය.

(3) සාමාන්‍යාධිකාරීවරයා බැංකුවේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු ය.

(4) පළමු පත්වීම දින සිට මාස හයක කාලයක ආරම්භක පරිවාස කාලසීමාවක් ද ඇතුළුව සාමාන්‍යාධිකාරිවරයාගේ ධුර කාලය වසර තුනක් විය යුතු ය.

(5) සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම හා කිරීම සතුටුදායක වන්නේ නම් මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ ධුර කාලය සෑම වසර තුනකට වරක් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(27) (1) බැංකුකරණය ජෙයෂ්ඨ කළමණාකරන මට්ටමේ අවුරුදු අටක අවම පළපුරුද්දක් සහිත තැනැත්තන් අතරින් හතර දෙනෙකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් ලෙස මණ්ඩලය විසින් තෝරා පත්කරගනු ලැබිය යුතු ය.

සෑම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකුම –

(අ) අදාල ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් සහිත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් දරන්නකු ; හෝ
(ආ) බැංකුකරණයේ සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිත තැනැත්තකු;
විය යුතු ය.

(2) සෑම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකුම බැංකුවේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු ය.

(3) මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැකසුනු හොඳම ආකාරයෙන් මණ්ඩලයේ පොදු විධාන, අධීක්ෂණය සහ පාලනයට යටත්ව බැංකුවේ කටයුතු පවත්වාගෙන යෑම, කළමනාකරණය හා පරිපාලනය සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සාමාන්‍යාධිකාරිවරයාට සහාය දැක්විය යුතුය.

(4) පළමු පත්වීමේ දින සිට මාස හයක ආරම්භක පරිවාස කාලසීමාවක් ද ඇතුළුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකුගේ ධුරකාලය අවුරුදු තුනක කාලයක් විය යුතු ය.

(5) සෑම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකුගේම වැඩ පිළිබඳ සෑහීමට පත් විය හැකි ස්වභාවයක පවතී නම්, ඔහුගේ ධුර කාලය මණ්ඩලය විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

**28.** (1) බැංකුවේ කටයුතු යථා පරිදි පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි විශ්‍රාම යෑමේ වයස, විනය පාලනය සහ වෙනත් යම් කරුණු සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරිවරයා විසින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) බැංකුවේ සේවා නියුක්තිකයන් එකී විධිවිධානවලට එකඟව කටයුතු කළ යුතු ය.

**29.** (1) බැංකුකරණයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ හෝ මුල්‍ය පිළිබඳ අවුරුදු හතක පළපුරුද්දක් සහිත තැනැත්තන් එක් එක් ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන් ලෙස මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම තැනැත්තන් –

(අ) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ක්ෂේත්‍රයක, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් දරන්නකු ; හෝ

(ආ) බැංකුකරණය පිළිබඳ පූර්ණ සුදුසුකම් සහිත තැනැත්තකු විය යුතු අතර, ඔවුන් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියම සහ සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(2) සියලු ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන් බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා වෙත වාර්තා කළ යුතු ය.

(3) සියලුම ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිවරුන් විසින් ඉතිරි කිරීම් උනන්දු කරවීම සඳහා, සුදුසු ණය ලබාදීම් සහතික කිරීම සඳහා සහ ප්‍රාදේශීය යොමුගත සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වග කියනු ලැබිය යුතු ය.

**30.** (1) මණ්ඩලය විසින් සිය කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන් පත් කර ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ සේවා කොන්දේසිවලට යටත්ව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ යම් අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

## V වන කොටස
## **බැංකුවේ ගිණුම් විගණනය කිරීම.**

**31.** බැංකුවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

**32.** බැංකුව විසින් ස්වකීය ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් හා බැංකුවේ වෙනත් සියලු මූල්‍ය ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

**33.** බැංකුවේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරනු ලැබිය යුතු ය.

**34.** බැංකුවේ පහත දැක්වෙන ලේඛන සලකා බැලීම සඳහා සෑම මුදල් වර්ෂයක්ම ඉකුත්වී මාස හතරක කාලයක් නොඉක්මවූ කාලයක දී බැංකුවේ කොටස් හිමියන්ගේ විශේෂ මණ්ඩල රැස්වීමක් පවත්වනු ලැබිය යුතු ය:

(i) ශේෂ පත්‍රය ;

(ii) ලාභ සහ අලාභ ගිණුම ;

(iii) විගණකාධිපතිගේ වාර්තාව ;

(iv) ගිණුම් සකස් කරනු ලැබ ඇත්තේ යම් මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ මුදල් වර්ෂය තුළ දී බැංකුවේ කටයුතු පිළිබඳ විස්තරයක් දැක්වෙන මණ්ඩලයේ වාර්ෂික බැංකු වාර්තාව ; සහ

(v) එළඹෙන්නා වූ වර්ෂ තුනක කාලයක් සඳහා බැංකුවේ අපේක්ෂිත ක්‍රියා සමාලෝචනයක්.

35. බැංකුවේ විශේෂ මණ්ඩල රැස්වීමක අවසානයේ දී මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා වෙත ලැබීමට සැලැස්විය යුතු අතර, අමාත්‍යවරයා විසින්, එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

36. පහත දැක්වෙන ලිඛිත නීතිවල විධිවිධාන බැංකුවට සහ බැංකුව සම්බන්ධව අදාළ නොවිය යුතු ය. –

(අ) (80 වන අධිකාරය වූ) මුදල් ණයට දීමේ ආඥා පනත ;

(ආ) (81 වන අධිකාරය වූ) ණය සහයෝගිතා ආඥාපනත ; සහ

(ඇ) (90 වන අධිකාරය වූ) උකස් කරුවන්ගේ ආඥාපනත.

37. බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකුම, නිලධරයකුම හෝ වෙනත් සේවා නියුක්තයකු විසින් තමා විසින් ඕනෑකමින් කරන ලද ක්‍රියාවකින් හෝ පැහැර හැරීමකින් හැර, එකී අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සේවා නියුක්තිකයා විසින් තම කාර්යය ඉටු කිරීම සම්බන්ධයෙන් හෝ තමා විසින් හෝ දරන ලද සියලු පාඩු සහ වියදම් බැංකුව විසින් හානිපූරණය කරනු ලැබිය යුතු ය.

38. (1) අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු, නිලධරයකු, සේවා නියුක්තයකු, අනුයෝජිතයකු හෝ බැංකුවේ ව්‍යාපාරික කටයුතුවල සේවයේ නියුක්ත වෙනත් සෑම තැනැත්තකුම සිය රාජකාරී කටයුතු ආරම්භයට පෙර බැංකුවේ සියලු ගනුදෙනු, එහි ගනුදෙනුකරුවන්, යම් තැනැත්තකු හෝ ආයතනයක් සමඟ කරන ලද ගිණුම් පිළිබඳ තත්ත්වය සහ ඒවාට අදාළ ඒ හා සම්බන්ධ සියලු කරුණු පිළිබඳව දැඩි රහස්‍යතාව රකින බවට ප්‍රතිඥා දෙන ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු අතර, පහත සඳහන් කාරණාවල දී හැර,

එනම් –

(අ) ඒවා හෙළිදරව් කරන ලෙස –

(i) මණ්ඩලය විසින්;
(ii) යම් අධිකරණයක් විසින්;
(iii) එකී කරුණ සම්බන්ධ වන්නා වූ තැනැත්තා විසින්; හෝ
(iv) මුදල් මණ්ඩලය විසින් ;

නියම කරනු ලබන අවස්ථාවක දී;

(ආ) ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී; හෝ
(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක තත්කාලයේ බලපවත්නා විධිවිධානවලට එකඟව ක්‍රියා කිරීම පිණිස හැර,

හෙළිදරව් නොකිරීමට ඒ ප්‍රකාශයෙන් ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

(2) බැංකුවේ ව්‍යාපාරික කටයුතුවල යෙදී සිටින සෑම අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු, නිලධරයකු, සේවා නියුක්තයකු, අනුයෝජිතයකු හෝ වෙනත් තැනැත්තකු විසින් බැංකුවේ ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ යම් ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීමේ දී, (1) වන උප වගන්තිය යටතේ රහස්‍යභාවය පිළිබඳව තමාගේ පොරොන්දුව කඩ නොකරමින් එම ප්‍රශ්නයට තමාට පිළිතුරු දිය නොහැකි නම්, ඒ තැනැත්තා විසින් එකී ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා විසින් අත්සන් කරන ලද ප්‍රකාශය උල්ලංඝනය කරමින් යම් තොරතුරක් හෙළිදරව් කරන බැංකුවේ ව්‍යාපාරික කටයුතුවල යෙදී සිටන සෑම අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු, නිලධරයකු, සේවා නියුක්තිකයකු, අනුයෝජිතයකු හෝ වෙනත් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක්

නොඉක්මවන දඩයකට, ඒ දඩය මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දඩ ප්‍රමාණය ඉක්මවන්නේ වුව ද, ඔහු යටත් විය යුතු ය.

**39.** (1) මේ පනත යටතේ රීති සෑදීමට නියමිත හෝ බලය දී ඇති සියලු කාරණා හෝ මේ පනත යටතේ බැංකුවේ බලතල සහ කාර්ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට බැංකුවට හැකි වන පරිදි අවශ්‍ය වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සෑදීමට අවශ්‍ය බවට බලය ලබා දී ඇති සියලු හෝ යම් කාරණා පිළිබඳ මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කිරීමේ දින සිට හෝ රීති මගින් නිශ්චිතව දැක්වෙන යම් පසු දිනයක දී එම රීති බලාත්මක විය යුතු ය.

**40.** බැංකුව –

(අ) 1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සහ 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව "ණය දෙන ආයතනයක්" විය යුතු ය ;

(ආ) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව "බැංකුවක්" විය යුතු ය ;

(ඇ) 1988 අංක 30 දරන බැංකු පනතේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" විය යුතු අතර, සංස්ථාගත නියමයේ සඳහන් ස්ථානයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා වූ එම පනතේ විධිවිධාන ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, බලපත්‍රලාභී විශේෂිත බැංකු සම්බන්ධයෙන් මේ පනත යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන සියලු විධානයන්ට යටත් විය යුතු ය;

(ඈ) (89 වන අධිකාරය වූ) උකස් පනතේ 47අ වගන්තියේ අර්ථානුකූලව"ණය දෙන ආයතනයක්" විය යුතු ය;

(ඉ) (89 වන අධිකාරය වූ) උකස් පනතේ සහ 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනතේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව "අනුමත ණය නියෝජ්‍ය ආයතනයක්" විය යුතු ය;

(ඊ) (433 වන අධිකාරය වූ) මුදල් පනතේ 108අ වගන්තියේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව "බැංකු ආයතනයක්" විය යුතු ය.

**41.** බැංකුව විසින් ලබා ගන්නා ලද සෑම ණයක් සඳහාම මහ බැංකුව විසින් තත්කාර්ය සඳහා ක්‍රියාත්මක කරනු ලබන අදාළ වැඩසටහන් යටතේ පිරිනමන ණය ඇපකර ආවරණය මගින් ආරක්ෂාව දිය යුතු ය.

## VI වන කොටස
## **සංවර්ධන බැංකුවල ව්‍යාපාර කටයුතු පැවරීම**

**42.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, මේ පනතේ 2 වන වගන්තිය යටතේ බැංකුවක් පිහිටුවීමෙන් පසු සැලකිය යුතු සාධාරණ කාලයක් ඇතුළත, (මෙහි මින්මතු "පැවරීමේ නියමය" යනුවෙන් හඳුන්වනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ක්‍රියාත්මක වීම සඳහා අවසර දී ඇති සංවර්ධන බැංකු වන්නා වූ මෙම පනතේ උපලේඛනයේ "පැවරීමේ බැංකුව හෝ බැංකු" යනුවෙන් නිශ්චිතව දක්වා ඇති සංවර්ධන බැංකු මගින් දැනට පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික කටයුතු (මෙහි මින් මතු "අත්කර ගැනීමේ බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද බැංකුව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් දැනට කර ගෙන යනු ලබන ව්‍යාපාරික කටයුතු වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ :–

(අ) පැවරීමේ නියමයේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවරීමේ බැංකුව හෝ බැංකුවලට අයත් වූ (මුදල් අතිරික්ත, සංචිත අරමුදල්, ආයෝජන සහ තැන්පතු ඇතුළුව) සියලු නිශ්චල සහ චංචල දේපළ ;

(ආ) පැවරීමේ නියමයේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවරීමේ බැංකුව හෝ බැංකුවලට අයත් වූ යම් චංචල හෝ නිශ්චල දේපළක හෝ දේපළවලින් හෝ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස උද්ගත වන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාර හා සම්බන්ධකම් සහ ඒ පැවරීමේ බැංකුව හෝ බැංකු විසින් භුක්ති විඳිනු ලැබූ යම් නිශ්චල දේපළක බදු දීමේ අයිතිවාසිකම්;

(ඇ) පැවරීමේ නියමයේ දිනයට පෙරාතුවම දිනයේ පැවති පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල පැවති සියලු වගකීම් ; හා

(ඈ) පැවරීමේ නියමයේ දිනයට පෙරාතුවම වූ දිනයේ පැවති එකී බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ එකී පැවරීමේ බැංකුව හෝ බැංකු වල ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ හෝ ආශ්‍රිත සියලු පොත්, ගිණුම් සහ ලේඛන.

43. අවස්ථාවෝචිත පරිදි, යම් පැවරීමේ බැංකුවක හෝ සියලු පැවරීමේ බැංකුවල ව්‍යාපාරික කටයුතු අත්කර ගැනීමේ බැංකුව, වෙත පැවරීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි –

(අ) පැවරීමේ බැංකුවේ හෝ බැංකුවලින් පැවරුණු ව්‍යාපාරික කටයුතුවල පාලනය හා සන්තකය අත්කර ගැනීමේ බැංකුවට තිබිය යුතු අතර, ඒ පැවරීමේ බැංකුවේ හෝ බැංකු සතු ව්‍යාපාරික කටයුතුවල පැවරුම්ලාභියා වන්නේ ය;

(ආ) 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සංස්ථාගත කරන ලද මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන සංවර්ධන බැංකුවල සංස්ථාගත කිරීමේ නියමයෙන් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු වන්නේ ය.

44. (1) පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ව්‍යාපාර කටයුතුවල ශුද්ධ වටිනාකම විමසා බැලීමේ කාර්ය සඳහා මුදල් මණ්ඩලය එකී, පවරන ලද ව්‍යාපාර කටයුතු සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයා විසින්, මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත මුදල් මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මුදල් මණ්ඩලය විසින් එම වාර්තාව සැලකිල්ලට ගත යුතු අතර, එකී වාර්තාව පිළි ගැනීමට පෙර අවශ්‍ය වන්නේ නම් තවදුරටත් වූ යම් තොරතුරු හෝ පැහැදිලි කිරීම් කරන ලෙස එම විගණකවරයා වෙත නියම කරනු ලැබිය හැකි ය.

45. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් බැංකු පැවරීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත පරිච්ඡින්න කරනු ලැබේ.

(2) පැවරීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි –

(අ) පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල පැවරුනු ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධ හෝ අදාළ වන්නා වූ පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවතුනා වූ හෝ බලාත්මකව තිබුණා වූ ද පැවරීමේ බැංකුව හෝ බැංකු පාර්ශ්වකරුවකු වන්නා වූ හෝ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල වාසියට ඇත්තා වූ ද, සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, ඇටෝනි බලතල, නීති නියෝජන ප්‍රදාන සහ කවර වූ ස්වභාවයේ වෙනත් සාධන පත්‍ර පැවරීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්කර ගැනීමේ බැංකුව විසින් අවස්ථාවෝචිත පරිදි, ඇතුළත් වූ හෝ ප්‍රදානය කරන ලද ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, ඇටෝනි බලපත්‍ර, නීති නියෝජන ප්‍රදාන හෝ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) පැවරීමේ බැංකුවේ හෝ බැංකු විසින් හෝ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවලට එරෙහිව හෝ පවරන ලද්දා වූ ද ඒ බැංකුවේ හෝ බැංකුවලට සම්බන්ධ හෝ ආශ්‍රිත එකී බැංකුවේ හෝ බැංකු වෙත පැවරුනු ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් අදාළ වූ ද පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී විනිශ්චයට භාජනව පැවති කවර වූ ස්වභාවයක සියලු නඩු හා නීති කෘත්‍ය, පැවරීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්කර ගැනීමේ බැංකුව විසින් හෝ එයට එරෙහිව පවරන ලද නඩු හෝ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ පිළිබඳව කටයුතු කර ගෙන යා හැකි ය ; නැතහොත් නඩු පවරනු ලැබිය හැකි ය.

(ඇ) පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති පැවරීමේ බැංකුවේ සියලු මුදල් විශේෂ සංචිත අරමුදලට මාරු කරනු ලැබිය යුතු අතර එය එම අරමුදලේ කොටසක් එමගින් සකස් විය යුතු ය;

(ඇ) පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී එකී පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ස්ථිර තනතුරු දරන්නා වූ සියලු නිලධරයන් සහ සේවකයන්හට එම පැවරීමේ දින සිට බලාත්මක වන පරිදි ඔවුන් පළමුව භුක්ති විඳින ලද සේවා නියමයන් සහ කොන්දේසිවලට වඩා අඩු වාසිගත තත්වයක් ඇති නොවන්නා වූ නියම හා කොන්දේසි මත අත්කර ගැනීමේ බැංකුවේ සේවා නියුක්තිය අර්පණය කළ යුතු අතර –

(i) එකී නිලධරයා ඒ අර්පණය පිළිගනු ලැබූ අවස්ථාවකදී, එකී නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද සැලකිල්ලට ගෙන අත්කර ගැනීමේ බැංකුව සාධාරණ යැයි සලකනු ලබන ආකාරයට සහ එහි යම් සඳහන් නියම සහ සේවා කොන්දේසි මත එකී නිලධරයන් සහ සේවා නියුක්තයන් සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය; සහ

(ii) ඒ අර්පණය එවැනි නිලධරයකු පිළිගනු නොලබන අවස්ථාවක දී, එකී නිලධරයා සහ සේවා නියුක්තයාට 46 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලබන ආකාරයට වන්දි මුදල් ලබා ගැනීමට හිමිකමක් තිබිය යුතු ය.

**46.** 45 වන වගන්තියේ (ඇ) ඡේදය (ii) වන උපඡේදයේ සඳහන් යම් පැවරීමේ බැංකුවක හෝ බැංකුවල යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු වෙත ඉහත කී වගන්තිය ප්‍රකාර වන්දි මුදල් ගෙවනු ලැබීමට හිමිකම් ඇති අවස්ථාවක, අත්කර ගැනීමේ බැංකුව විසින් ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය කම්කරු කොමසාරිස්වරයා විමසා තීරණය කළ යුතු අතර, එම තීරණය එකී නිලධරයාට හෝ සේවා නියුක්තයාට වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තිබිය හැකි වෙනත් යම් අයිතිවාසිකම්වලට බලපෑමක් නොවන සේ සලකනු ලැබිය යුතු ය.

**47.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**48.** මේ පනතේ, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස –

"ණයට දීම" යන්නෙන්, යම් අනියම් වගකීමක් පිළිගැනීම සඳහා කරන ලද පොරොන්දුවක්ද ඇතුළුව යම් ණයක්, අයිරා පහසුකමක්, අත්තිකාරමක් හෝ යම් ණය මුදලක්, අයිරාවක් හෝ අත්තිකාරමක් ප්‍රදානය කිරීම සඳහා වූ පොරොන්දුවක් අදහස් වේ;

"බැංකු පනත" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ;

"ලංකා බැංකුව" යන්නෙන්, (397 වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත මගින් පිහිටුවන ලද ලංකා බැංකුව අදහස් වේ;

"බැංකු ආයතනය" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ලියාපදිංචි කරන ලද බැංකුවක් අදහස් වේ;

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"ව්‍යවසාය" යන්නෙන්, සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද, ඕනෑම ආකාරයක නමකින් හෝ නාමයකින් හඳුන්වනු ලබන සහ පරම සංස්ථාවක් හෝ පරම අයිතියක් ඇතුළත් වන යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වශයෙන් බලපත්‍රලත් හෝ බලපත්‍රලත් ලෙස සලකනු ලබන යම් වාණිජ බැංකුවක් අදහස් වේ;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස බලපත්‍රලත් හෝ බලපත්‍රලත් ලෙස සලකනු ලබන සමාගමක් හෝ ආයතනයක් අදහස් වේ;

"සූක්ෂ්ම, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය" යන්නෙන්, නිශ්චිත වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන පනහකට අඩු ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ යම් ව්‍යාපෘතියක් අදහස් වේ ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ ;

"ජාතික ඉතිරි කිරීමේ බැංකුව" යන්නෙන්, 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකුව පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ ;

"පවරන ලද බැංකුවක හෝ බැංකුවල ශුද්ධ වටිනාකම" යන්නෙන්, 42 වන වගන්තිය යටතේ කරන ලද නියමය ප්‍රකාර අත්කර ගැනීමේ බැංකුවක් වෙත පවරන ලද බැංකුවේ හෝ බැංකුවල වත්කම්වල වටිනාකමින් එකී නියමය යටතේ අත්කර ගැනීමේ බැංකුව වෙත පැවරුනු බැංකුවේ හෝ බැංකුවල වගකීම් අඩු කළ පසු ඉතිරි වන වටිනාකම (44 වන වගන්තිය යටතේ නම් කරනු ලබන විගණකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි අය කර ගැනීමට නොහැකි වත්කම් බැහැර කොට) අදහස් වේ ;

"මහජන බැංකුව" යන්නෙන්, 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් පිහිටුවනු ලැබූ මහජන බැංකුව අදහස් වේ ;

"සංවර්ධන බැංකුව හෝ බැංකු" යන්නෙන්, 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ බැංකුවක් හෝ බැංකු අදහස් වේ ;

"පවරන ලද බැංකුවක් හෝ බැංකු සම්බන්ධයෙන් "පවරන ලද ව්‍යාපාරය" යන්නෙන්, 42 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් අත්කර ගැනීමේ බැංකුවක් වෙත පවරන ලද බැංකුවක හෝ බැංකුවල ව්‍යාපාරයක් අදහස් වේ.

### උපලේඛනය

1. 1998 ඔක්තෝබර් 14 වන දින අංක 1049/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ රජරට සංවර්ධන බැංකුව.
2. 1998 නොවැම්බර් 11 වන දින අංක 1053/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ ඌව සංවර්ධන බැංකුව.
3. 1998 නොවැම්බර් 11 වන දින අංක 1053/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ සබරගමුව සංවර්ධන බැංකුව.
4. 1998 නොවැම්බර් 11 වන දින අංක 1053/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ වයඹ සංවර්ධන බැංකුව.
5. 1998 ඔක්තෝබර් 14 වන දින අංක 1049/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ රුහුණු සංවර්ධන බැංකුව.
6. කඳුරට සංවර්ධන බැංකුව.

## 2008 අංක 42 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 දෙසැම්බර් මස 03 වන දින]

### 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

1. මේ පනත, 2008 අංක 42 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු, ප්‍රධාන ප්‍රඥප්ති, යනුවෙන් සඳහන් කරනු ලබන) 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ දීර්ඝ නාමයේ දී "පහසු කරවීමේ අදහසින් යුතුව ණය දෙන ආයතනවලින් ණය ගැනුම්කරුවන්ට අදාළ වන ණය තොරතුරු එක්රැස් කිරීම පිණිස ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පිහිටුවීම සඳහා සහ කාර්යාංශයේ කොටස් හිමියන්ට ඒ තොරතුරු සැපයීම සඳහා ද" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

   "පහසු කරවීමේ අදහසින් යුතුව ණය දෙන ආයතනවලින්, ණය ගැනුම්කරුවන්ට සහ ණය ප්‍රදානය කරන ආයතනවලින් පාරිභෝගිකයන්ට අදාළ වන ණය තොරතුරු රැස් කිරීම පිණිස ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පිහිටුවීම සඳහා සහ එම තොරතුරු ඉල්ලීම මත, කාර්යාංශයේ කොටස් හිමියන්ට සහ එම තොරතුරු ලබා ගැනීමට හිමිකම් ඇති බලධරයන්ට සහ ආයතනවලට ඒ තොරතුරු සැපයීම සඳහා ද".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ දී "කොළඹ" යන වචනය වෙනුවට, එම වගන්තියේ එම වචනය ඇති කවර හෝ ස්ථානයක ඒ වෙනුවට දී "බස්නාහිර පළාත" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (vii) සහ (viii) වන ඡේද ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(vii) බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරු වන තැනැත්තන් අතුරින් මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තෙක්;

(viii) කොටස් හිමි කල්බදු ආයතන විසින් තෝරා පත් කර ගනු ලබන තැනැත්තෙක් ; සහ

(ix) කාර්යාංශයේ සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් ධූර දරන තැනැත්තා;"

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

6. කාර්යාංශයේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතුය :–

ආර්ථිකයේ සියලු අංශයන්ට සහ විශේෂයෙන්ම අවිධිමත් අංශයට ණය බෙදා හැරීම පහසු කිරීමේ අදහසින් :–

කාර්යාංශයේ කර්තව්‍ය

(අ) 7අ වගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල වර්ග වලින් ණය සහ මූල්‍ය තොරතුරු රැස් කිරීම, සැසඳීම සහ සංස්ලේෂණය කිරීම;

(ආ) 7ආ වගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩලවල ඉල්ලීම මත එම තැනැත්තන්ට හෝ පුද්ගල මණ්ඩලවලට ණය සහ මූල්‍ය තොරතුරු සැපයීම;

(ඇ) ණය ශ්‍රේණිගත කිරීමේ කර්තව්‍ය භාර ගැනීම සහ එම ණය ශ්‍රේණිගත කිරීම් ඉල්ලා සිටින යම් විදේශීය හෝ දේශීය නියෝජිත ආයතනවලට හෝ යම් තැනැත්තකුට එම ණය ශ්‍රේණිගත කිරීම් ලබාදීම;

(ඈ) ශ්‍රී ලංකාවේ ණය දෙන ආයතන සහ ණය ප්‍රදානය කරන ආයතනවල ඉල්ලීම මත පුද්ගලයන් පිළිබඳ ණය ලකුණු සැපයීම සහ අනෙකුත් අගය එකතු කළ සේවාවන් සැපයීම;

(ඉ) කාර්යාංශයේ කොටස් හිමි ණය දෙන ආයතන සහ සහභාගී ණය ප්‍රදානය කිරීමේ ආයතන සඳහා පර්යේෂණ සහ පුහුණු ව්‍යාපෘති භාර ගැනීම; සහ

(ඊ) ආණ්ඩුව විසින් විධාන කරනු ලැබුවහොත්, චංචල දේපළවල සුරක්ෂිතභාවය පිළිබඳ අයිතිය ලියාපදිංචි කිරීම සඳහා ආරක්ෂිත ගනුදෙනු ලියාපදිංචි කිරීමේ කාර්යාලයක් ක්‍රියාත්මක කිරීම".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එම වගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :–

"(අ) 7අ වගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති ආයතනවල දත්ත බැංකුවක් පවත්වාගෙන යාම;

(ආ) 7අ වගන්තියේ දක්වා ඇති තැනැත්තන් හෝ ඕනෑම තැනැත්තකුගෙන් ණය සහ මූල්‍ය තොරතුරු රැස් කිරීම, සැසඳීම සහ සංස්ලේෂණය කිරීම; "

(2) එම වගන්තියේ (ඇ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:-

"(ඇ) කාර්යාංශය විසින් තීරණය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව, 7ආ වගන්තියේ සඳහන් තැනැත්තන්ට සහ පුද්ගල මණ්ඩලවලට ඉල්ලීමක් මත සහ රහසිගතව, ණය සහ මූල්‍ය තොරතුරු හෝ එම තොරතුරුවල යම් වර්ගයක් සැපයීම හෝ ණය ලකුණු සැපයීම් හෝ වෙනත් අගය එකතු කළ සේවා සැපයීම;

(ඇ ඇ) කාර්යාංශයේ ණය දෙන ආයතන සහ සහභාගී ණය ප්‍රදානය කිරීමේ ආයතනවල තීරණවලට සහාය දැක්වීමේ ක්‍රම වැනි අතිරේක සේවාවන් සැපයීමේ කාර්ය සඳහා වාණිජ බැංකුවලින් චෙක්පත් අගරු කිරීමට අදාළ තොරතුරු රැස් කිරීමට භාර ගැනීම; "

(3) එම වගන්තියේ (ඉ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඉ) ඉදිරිපත් කරනු ලබන ණය සහ මූල්‍ය තොරතුරු සඳහා හෝ සපයනු ලබන සේවා සඳහා ගාස්තු සහ වෙනත් අය කිරීම් ලබා ගැනීම හෝ තීරණය කරන ලද දායක මුදලක් ගෙවන ලෙස නියම කිරීම; "

(4) "(ක) ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් ඡේද ඇතුලත් කිරීමෙන්

(කක) 6 වන වගන්තියේ සඳහන් කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා යම් තැනැත්තකු හෝ සමාගමක් සමග සන්ධානගත වීම සහ ගිවිසුම්වලට ඇතුළත් වීම සඳහා සහ එහි ව්‍යාපාර කරගෙන යාම සඳහා ආධාරක සේවා සපයන යම් ව්‍යවසායකයක් පවත්වාගෙන යාම;

( කකක) ආණ්ඩුව විසින් විධාන කරනු ලැබුවහොත්, චංචල දේපළවල සුරකුම් අයිතිය ලියාපදිංචි කිරීම සඳහා සුරක්ෂිත ගනුදෙනු ලියාපදිංචි කිරීමේ කාර්යාලයක් ක්‍රියාත්මක කිරීම;"

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 7අ සහ 7ආ වගන්ති ලෙස බලාත්මක විය යුතුය :–

"ණය සහ මූල්‍ය තොරතුරු රැස්කර ගත හැකි තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල

7අ. මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී කාර්යාංශය විසින් පහත සඳහන් පුද්ගලයන් සහ ආයතන සම්බන්ධයෙන් තොරතුරු රැස් කළ හැකිය :-

(අ) ණය දෙන ආයතනවල ණය ගැනුම්කරුවන් සහ අනාගත ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන්;

(ආ) ණය ප්‍රදානය කරන ආයතනවල පාරිභෝගිකයන් සහ අනාගත පාරිභෝගිකයන් සම්බන්ධයෙන්;

(ඇ) රක්ෂණ සමාගම්වලින් රක්ෂණ ඔප්පු දරන්නන් සහ අනාගතයේ රක්ෂණ ඔප්පු දරන්නන් සම්බන්ධයෙන් සහ එම ඔප්පුවල පවාරණ අගය මත ප්‍රදානය කරන ලද ණය සම්බන්ධයෙන් තොරතුරු;

(ඈ) පුද්ගලයන් සම්බන්ධයෙන් 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතට ගැනෙන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාගෙන්;

(ඉ) සමාගම් සහ හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන්, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් ; සහ

(ඊ) සමාගම් සම්බන්ධයෙන් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද සමාගම් සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගෙන්.

7ආ. (1) ඉල්ලීමක් කරනු ලබන ලැබූ අවස්ථාවක දී කාර්යාංශය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉල්ලීමක් කරනු ලැබූ විට, පහත දැක්වෙන තැනැත්තන්ට හෝ පුද්ගල මණ්ඩලවලට තමන් වෙත ඇති ණය සහ මූල්‍ය තොරතුරු සැපයිය හැකි ය :–

(අ) යම් තැනැත්තකුගේ ණය ලැබීමේ සුදුසුකම හෝ ණය යෝග්‍යතාවය ඇගයීමේ හෝ සොයා දැන ගැනීමේ කාර්ය සඳහා සහ දැනට සිටින ණය ගැනුම්කරුවන් සමාලෝචනය කිරීමේ සහ නිරීක්ෂණය කිරීමේ කාර්ය සඳහා සහ දැනට සිටින ණය ගැනුම්කරුවන්ගේ හිඟ ණය එකතු කිරීම සඳහා කාර්යාංශයේ කොටස් හිමි ණය දෙන ආයතනනවලට සහ ජංගම ගිණුම් විවෘත කිරීමේ සහ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට;

(ආ) ණය දෙන ආයතනයක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු ලෙස පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම සඳහා යම් තැනැත්තකුගේ සුදුසුකම් සොයා ගැනීමේ කාර්ය සඳහා සහ ණය දෙන ආයතන නියාමනය සහ අධීක්ෂණය කිරීමේ සහ එම ආයතනවල ණය විශ්ලේෂණයේ තත්ත්වය වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට;

(ඇ) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම්කරුගේ ණය ගැනීමේ සුදුසුකම ඇගයීම සඳහා සහ අදාළ නීතියක ප්‍රකාරව විධිවිධාන සලසා ඇති අනුග්‍රහයක් ලබා දීම සඳහා හෝ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හිමිකම් ඇති බවට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන යම් ආණ්ඩුවේ නියෝජ්‍යායතනයක් හෝ ආයතනයකට;

(ඈ) යම් තැනැත්තකුගේ ණය ලැබීමේ සුදුසුකම සහ ණය යෝග්‍යතාවය ඇගයීමේ සහ සොයා දැන ගැනීමේ කාර්ය සහ දැනට සිටින පාරිභෝගිකයන් සමාලෝචනය කිරීමේ සහ නිරීක්ෂණය කිරීම සහ දැනට සිටින පාරිභෝගිකයන්ගේ හිඟ ණය එකතු කිරීමේ කාර්ය සඳහා සහභාගී වන ණය ප්‍රදානය කරන අයතනවලට;

(ඉ) ණය දෙන ආයතනවල ණය ගැනුම්කරුවන් සහ අනාගත ණය ගැනුම්කරුවන් හෝ ණය ප්‍රදානය කිරීමේ ආයතනවල පාරිභෝගිකයන් සහ අනාගත පාරිභෝගිකයන් සහ එම තොරතුරු අදාළ වන වෙනත් යම් තැනැත්තකුට;

(ඊ) එම තොරතුරු අදාළ වනුයේ යම් තැනත්තකුට ද, එම තැනැත්තාගේ කැමැත්තට යටත්ව ජාත්‍යන්තර ණය කාර්යාංශවලට;

(උ) යම් තැනැත්තකුගේ ණය ලැබීමේ යෝග්‍යතාවය සොයා දැන ගැනීමේ කාර්ය සඳහා සහ එම තැනැත්තා රක්ෂණය කිරීමේ හැකියාව දැන ගැනීමේ කාර්ය සඳහා සහ ප්‍රාරක්ෂණ කාර්ය සඳහා එම තොරතුරු අදාළ වන තැනැත්තාගේ කැමැත්ත ඇතිව යම් රක්ෂණ සමාගමකට; සහ

(ඌ) මේ වගන්තියේ කාර්ය සඳහා මුදල් මණ්ඩලයේ නිර්දේශය මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල හඳුනා ගනු ලැබිය හැකි වෙනත් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල.

(2) කාර්යාංශය මගින් එම තොරතුරු ලබා දීමේ දී මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි එම තොරතුරු පාවිච්චි කළ හැකි අරමුණු ඇතුළු අදාළ නියම හා කොන්දේසි කාර්යාංශය විසින් පනවනු ලැබිය හැකි ය".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–
(3) වන සහ (4) වන උප වගන්ති ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන් :–
"(3) මේ වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද -

(අ) මුදල් මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ අනුපාතයට අනුව කාර්යාංශයේ කොටස්, ණය දෙන ආයතනවලට මණ්ඩලය විසින් වෙන් කිරීම හෝ පැවරීම කළ හැකි ය;

(ආ) 6 වන වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් කටයුතුවලට අදාළ තාක්ෂණය වැඩි දියුණු කිරීමේ නියැලී සිටින යම් තැනැත්තකුට මණ්ඩලය විසින් කොටස් වෙන් කළ හැකි ය.

(4) මූලික කොටස් නිකුත් කිරීමෙන් පසුව කාර්යාංශය විසින් කොටස් වෙන්කර දීමක් හෝ පැවරීමක් කාර්යාංශය විසින් තීරණය කරනු ලැබ, මුදල් මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව සිදු කරනු ලැබිය යුතු ය.

(5) 3 වන සහ 4 වන උපවගන්ති යටතේ කාර්යාංශයේ කොටස් වෙන්කර දීම හෝ පැවරීම සඳහා අනුමතය ප්‍රදානය කිරීමේ දී මුදල් මණ්ඩලය විසින් සියලු අවස්ථාවලදී -

(අ) මුදල් මණ්ඩලය විසින් කාර්යාංශයේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට නොඅඩු ප්‍රමාණයක් රඳවා තබා ගත යුතු බවට;

(ආ) මුදල් මණ්ඩලය සහ රාජ්‍ය සංස්ථාවක් වන්නා වූ වෙනත් යම් ණය දෙන ආයතනයක් විසින් දරනු ලබන සමස්ත කොටස් දැරීම, කාර්යාංශයේ නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට පනස් එකකට නොඅඩු විය යුතු බවට; සහ

(ඇ) රාජ්‍ය සංස්ථාවක් නොවන යම් ණය දෙන ආයතනයක් හෝ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වෙනත් යම් තැනැත්තකු විසින් කාර්යාංශයේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි ප්‍රමාණයක් දරනු නොලැබිය යුතු බවට,
සහතික විය යුතු ය.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

"මණ්ඩලය විසින් ණය ගැනීම්

12 (1) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත කාර්යාංශය විසින්, කලින් කල, යම් ණය දෙන ආයතනවලින් හෝ වෙනත් යම් දේශීය හෝ විදේශීය ආයතනවලින් ණය ලබා ගත හැකි ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමයන්ට අනුකූලව කාර්යාංශයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා කාර්යාංශය විසින් ඍණ පත්‍ර හෝ වෙනත් සුරැකුම්පත් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උප වගන්තිය යටතේ කාර්යාංශය විසින් ලබා ගන්නා ණය මුදල්වල එකතුව කාර්යාංශයේ ගෙවා නිමි ප්‍රාග්ධනය මෙන් දෙගුණයකට සමාන මුදලක් ඉක්මවන අවස්ථාවක දී කොටස් හිමියන්ගෙන් බහුතරයක එකඟත්වය නොමැතිව එම ණය මුදල් ලබා නොගත යුතුය".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 19අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :–

"මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීම.

19අ. (1) කාර්යාංශයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස නමයක් ඇතුළත මණ්ඩලය විසින් කාර්යාංශයේ කොටස් හිමියාගේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය.

(2) කාර්යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව සහ ගිණුම් එම රැස්වීමේ දී සලකා බැලිය යුතු ය.

(3) වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ ක්‍රමය සහ එම රැස්වීමේ කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ උචිත යැයි සලකනු ලබන පරිදි පළ කරනු ලැබිය යුතුය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන සහ 22 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :-

"කාර්යාංශය විසින් තොරතුරු කැඳවනු ලැබිය හැකි බව.

21. (1) කාර්යාංශය විසින් හෝ ත ත් කාර්ය සඳහා කාර්යාංශය විසින් බලය පවරනු ලබන වෙනත් යම් තැනැත්තකු විසින් ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කළ හැකි කාල සීමාව ඇතුළත මේ පනත යටතේ ඉදිරිපත් කිරීමට බැඳී ඇති තොරතුරු කාර්යාංශයට හෝ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකුට හෝ ඉදිරිපත් කරන ලෙස 7අ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආයතනවලට නියම කරනු ලැබිය හැකි ය.

(2) 7අ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ආයතනයක් පිහිටුවීමේ නීතිවල හෝ වෙනත් යම් නීතියක හෝ පාරිභෝගිකයන් හෝ ණය ගැණුම්කරුවන් සහ 7අ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආයතන අතර එළඹුනු යම් ගිවිසුමක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් දැන්වීමක සඳහන් කාලසීමාව ඇතුළත එම දැන්වීමේ නියමයන්ට අනුව ක්‍රියා කිරීම එම ආයතනයේ හෝ මේ පනත යටතේ තොරතුරු ඉදිරිපත් කිරීමට බැඳී සිටින හෝ (1) වන උප වගන්තිය යටතේ යවනු ලබන දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් යම් වාර්තාවක් හෝ තොරතුරු ඉදිරිපත් කිරීමට නියමිත යම් තැනැත්තකුගේ කාර්ය වන්නේ ය.

(3) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට හැර (1) වන උප වගන්තියේ නියමයන්ට අනුකූලව ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක අන්තර්ගත යම් තොරතුරු කාර්යාංශය විසින් පළ කිරීම හෝ යම් තැනැත්තකුට දැනුම්දීම නොකළ යුතු ය.

"තොරතුරු හෙළි නොකිරීමට ඇති කාර්යභාරය.

22. (1) මේ පනතේ කාර්ය සඳහා හැර හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෙළි කිරීමට නියම කරනු ලැබූ විට හැර, මේ පනත යටතේ කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් හෙළි කිරීම හෝ මේ පනත යටතේ කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් හෝ වෙනත් තොරතුරක් අධිකරණයක් වෙත හෝ වෙනත් ආයතනයක් වෙත ඉදිරිපත් කිරීම කාර්යාංශයේ කිසිම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් නොකළ යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා හැර හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෙළි කරන ලෙස නියම කරනු ලැබූ විට දී හැර, මේ පනත යටතේ කාර්යාංශය විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් හෙළි කිරීමේ හෝ මේ පනත යටතේ කාර්යාංශය විසින් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් හෝ වෙනත් තොරතුරක් අධිකරණයට හෝ වෙනත් ආයතනයකට ඉදිරිපත් කිරීම, ණය තොරතුරු ලබා ගැනීමට බලය පවරා ඇති යම් ආයතනයක සේවයේ නියුක්ත කිසිම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් නොකළ යුතු ය".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ණය දෙන ආයතන" යන වචන වෙනුවට "ණය තොරතුරු ලබා ගැනීමට බලය පැවරී ඇති ආයතන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 26අ. 26ආ සහ 26ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතුය :-

"ණය තොරතුරු සැපයීම, කාර්යාංශය විසින් අත්හිටුවිය යුතු බව.

26අ. (1) ණය තොරතුරු හෝ මූල්‍ය තොරතුරු ලබා ගැනීමට නැතහොත් කාර්යාංශයෙන් වෙනත් අගය එකතු කළ සේවාවන් ලබා ගැනීමට හිමිකම් ඇති 7ආ වගන්තියේ නිශ්චිතව දැක්වෙන යම් ආයතනයක අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු වන තැනැත්තකු විසින් 27(1)(අ),

(ආ), (ඇ) සහ (ඉ) වගන්ති යටතේ වරදක් සිදු කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට කාර්යාංශය සෑහීමකට පත් වන්නේ නම් කාර්යාංශය විසින් එම ආයතනයට එවැනි යම් තොරතුරු සැපයීම හෝ වෙනත් යම් සේවා සැපයීම අත්හිටුවීම සඳහා නියමයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර, (1) වන උප වගන්තියේ සඳහන් යම් ආයතනයකට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් කාර්යාංශය විසින් ලබා දිය යුතු ය.

(3) ඉහත (1) වන ඡේදය යටතේ කාර්යාංශය විසින් ණය සහ මූල්‍ය තොරතුරු ලබා දීම හෝ අනෙකුත් සේවාවන් සැපයීම නතර කිරීමට තීරණය කර ඇති අවස්ථාවක එවැනි යම් ආයතනයක් කාර්යාංශයේ කොටස් ප්‍රාග්ධනයෙන් හිමිකර ගෙන ඇති කොටස් වහාම මූල්‍ය මණ්ඩලය නමින් පවරන ලෙස එවැනි කොටස් හිමි ණය දෙන ආයතනයකට නියම කළ යුතු ය.

26ආ. කාර්යාංශය විසින් නිකුත් කරන ලද යම් ණය සහ මූල්‍ය පිළිබඳ තොරතුරක අන්තර්ගත තොරතුරු සම්බන්ධයෙන් 7අ සහ 7ආ වගන්තිවල සඳහන් යම් ආයතනයක් හෝ එම තොරතුරු අදාළ වන යම් තැනැත්තෙක් සහ කාර්යාංශය අතර ඇති වන ආරාවුලකට අදාළ යම් පැමිණිල්ලක් මුල් අවස්ථාවේ දී විභාග කොට තීරණය කිරීම සඳහා මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාට තනි සහ අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු ය.

26ඇ. (1) නියම කිරීම සඳහා මේ පනත මගින් නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීම සඳහා මේ පනත මගින් බලය පවරා ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි යː-

(2) (1) වන උප වගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි යː-

(අ) 7ආ ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ආයතන විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම සංග්‍රහය නිශ්චිතව දක්වමින්;

(ආ) ණය හා මූල්‍ය තොරතුරු අදාළ වන්නේ යම් තැනැත්තකුට ද එම තැනැත්තා විසින් ණය සහ මූල්‍ය තොරතුරු වාර්තාවේ ඇතුළත් දත්තයන්ට අදාළ වැරදි සටහන් අභියෝගයට ලක් කිරීම සඳහා සහ ඒවා වැරදි බවට ඔප්පු වුවහොත් එම වාර්තා නිවැරදි කිරීමට ගත යුතු ක්‍රියා පටිපාටිය දක්වමින්;

(ඇ) නිදහස් කිරීමට ඇති ණය සහ මූල්‍ය තොරතුරුවලට අදාළව කර්යාංශය විසින් නිකුත් කිරීමට ඇති විවිධ වාර්තාවල ඇතුළත් කළ යුතු වූ ද, මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නා වූ ද, අදාළ විස්තර නිශ්චිතව දක්වමින් සහ එම රීති සහ නියෝග මේ පනතේ විධිවිධානවලට අනුකූල නොවන බවට නිශ්චිතව දක්වමින්;

(ඈ) මේ පනත ප්‍රකාරව කාර්යාංශය වෙත තොරතුරු සහ වාර්තා ඉදිරිපත් කිරීමේ දී ආයතන සහ තැනැත්තන් විසින් භාවිතා කිරීමට ඇති ආකෘති පත්‍ර සහ ආකෘති නිශ්චිතව දක්වමින්".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේː-

(1) (1) වන උපවගන්තියේ-

(අ) (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්ː-
"(ඇ) මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් රීතියක හෝ නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරන,".

(ආ) (ඈ) ඡේදයේ "කාර්යාංශයේ අධ්‍යක්ෂවරයකු" යන වචන වෙනුවට "කාර්යාංශයේ හෝ යම් ඒකාබද්ධ ව්‍යවසායක හෝ සන්ධානයක අධ්‍යක්ෂවරයකු" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (ඉ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-
"(ඉ) කාර්යාංශයෙන් තොරතුරු ලබා ගැනීමට හිමිකම් ඇති 7ආ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ආයතනයක අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු විසින්, එවැනි ආයතනයක් විසින් කාර්යාංශයෙන් ලබා ගත් යම් ණය හෝ මූල්‍ය තොරතුරක්, ඒ තොරතුරු හෙළි කිරීමට තමාට මේ පනතින් බලය දෙන ලද කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළි කරන;".

(2) (2)වන උප වගන්තියේ, "රුපියල් එක්ලක්ෂයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්.

(3) (4) වන උපවගන්තියේ, "27(1) (අ) හෝ (ආ) යටතේ කරන ලද වරදෙහි අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් රුපියල් පනස් දහසකට නොවැඩි" යන වචන වෙනුවට "(1) වන උපවගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන්.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) "ලංකා බැංකුව" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""ආශ්‍රිත සාමාජිකයා" යන්නෙන් ණය තොරතුරු මුදා හැරීමට සහ වෙනත් සේවා සැපයීමට කාර්යාංශය විසින් අධිකාරිය සම්බන්ධයෙන් සහ ගාස්තු සහ වෙනත් දීමනා ගෙවීමට අදාළ නියම සහ කොන්දේසි සම්බන්ධයෙන් කාර්යාංශය සමඟ දායක ගිවිසුමකට අතුළත් වී ඇති මේ පනතේ 7ආ වගන්තියේ විශේෂිතව දක්වා ඇති යම් ආයතනයක් අදහස් වේ;

"ණය ගැණුම්කරු" යන්නෙන්, යම් ණය දෙන ආයතනයක් විසින් යම් තැනැත්තකුට යම් ණය සීමාවක් අනුමත කර ඇති තැනැත්තෙක් අදහස් වන අතර, ඔහු එම ණය මුදල ප්‍රයෝජනයට ගනු ලැබුව ද, නැති වුව ද ඊට –

(අ) සමාගමක් හෝ සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, එහි පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම්;

(ආ) ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වනවිට, එහි අයිතිකරු හෝ යම් කොටස්කරුවකු හෝ ඉහතින් වූ අවුරුදු දෙකක් ඇතුළත දී කොටස්කරුවකු වූ තැනැත්තෙක්; සහ

(ඇ) පුද්ගලයකු සම්බන්ධයෙන් වනවිට, එම පුද්ගලයා කොටස්කරුවකු වන්නේ හෝ හිමිකරු වන්නේ යම් ව්‍යාපාරයක ද, එම ව්‍යාපාරය හෝ එම පුද්ගලයා ඉහතින් ම වූ අවුරුදු දෙකක් ඇතුළත කොටස්කරුවකු වූ ව්‍යාපාරයක්;

(2) "මහ බැංකුව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"ණය තොරතුරු" යන්නෙන්-

(i) ණය දෙන ආයතනයක් විසින් යම් ණය ගැනුම්කරුවකුට හෝ ණය ගැනුම්කරුවන් කණ්ඩායමකට ප්‍රදානය කරන ලද ණය පහසුකම් පිළිබඳ විස්තරවලට අදාළ යම් තොරතුරක්;

(ii) යම් ණය ගැනුම්කරුවකුට හෝ ණය ගැනුම්කරුවන් කණ්ඩායමකට ප්‍රදානය කරන ලද ණය පහසුකම් සඳහා අවස්ථාවෝචිත පරිදි යම් ණය ගැනුම්කරුවකුගෙන් හෝ ණය ගැනුම්කරුවන් කණ්ඩායමකින් ණය දෙන ආයතනයක් විසින් ලබා ගෙන ඇති සුරැකුම්වල ස්වභාවයට අදාළ යම් තොරතුරු;

(iii) ස්වකීය ගනුදෙනුකරුවන්ගෙන් යම් ගනුදෙනුකරුවකුට හෝ ස්වකීය ගනුදෙනුකරුවන්ගේ යම් කණ්ඩායමකට ණය දෙන ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද ඇප සහතිකයකට හෝ වෙනත් යම් අරමුදල් පාදක කරගත් පහසුකමකට අදාළ යම් තොරතුරු;

(iv) තමා වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ණය දෙන ආයතනයකට හෝ ණය ප්‍රදානය කිරීමේ ආයතනයකට ණය ගැනුම්කරුවන් විසින් සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන යම් ඇප සහතිකවලට අදාළ යම් තොරතුරු;

(v) පාරිභෝගිකයකුට ණය ප්‍රදානය කිරීමේ ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් පිළිබඳ විස්තරවලට අදාළ යම් තොරතුරු;

(vi) යම් ණය ගැනුම්කරුවකුගේ හෝ ණය ගැනුම්කරුවන් කණ්ඩායමක හෝ පාරිභෝගිකයන්ගේ වත්පොහොසත්කම්, විස්තර, ණය ගනුදෙනුවල විස්තර හා ඉතිහාසය සහ ණය ලබාදීමට ඇති සුදුසුකමට අදාළ යම් තොරතුරු;

(vii) කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම්, ණය පහසුකමක හෝ ණය පහසුකම් වර්ගයේ ස්වභාවය මත තීරණය වෙමින් සීමිත හෝ අසීමිත කාලයක් සඳහා යම් ණය පහසුකමක ඉතිහාසයට අදාළ යම් තොරතුරු;

(viii) යම් චෙක්පතක් අගරුවීමේ දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා වාණිජ බැංකුවක යම් ගනුදෙනුකරුවකුගේ චෙක්පතක් අගරුවීමට අදාළ විස්තර සම්බන්ධයෙන් වූ තොරතුරු

(ix) ණය ප්‍රතිපත්තිය වඩාත් විධිමත් කිරීම සඳහා අදාළ බවට කාර්යාංශය විසින් සලකනු ලබන වෙනත් යම් තොරතුරු;

(x) අවුරුදු දෙකක කාලයක් ඇතුළත රජයේ නියොජ්‍යායතනයක් විසින් යම් තැනැත්තකුට ප්‍රදානය කරන ලද අනුග්‍රහ පිළිබඳ විස්තර සම්බන්ධයෙන් වූ යම් කොරතුරු;

(xi) රක්ෂණ සමාගම් මගින් සපයා දී ඇති වූ ද, වාරික මගින් ගෙවනු ලබන්නා වූ ද රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර සම්බන්ධයෙන් වූ තොරතුරු;

(xii) ණය සහ මූල්‍ය තොරතුරු ලබා ගැනීමට හිමිකම් ඇති යම් ආයතනයක් විසින් හෝ එම තොරතුරු අදාළ වන තැනැත්තා විසින් කරන ලද ඉල්ලීම් පිළිබඳ විස්තර සම්බන්ධයෙන් වූ තොරතුරු;

(xiii) ණය ලකුණු,

අදහස් වන අතර, අදාළ තැනැත්තාගේ නම, උපන් දිනය, උපත ලියාපදිංචි වීමේ දිනය, හැඳුනුම්පත් අංකය, අතීත සහ වර්තමාන ලිපිනයන්, සම්බන්ධවීමේ තොරතුරු, විවාහක, අවිවාහක බව, කලත්‍රයාගේ නම, අතීත සහ වර්තමාන රැකියාව/ව්‍යාපාරය, පුද්ගලයාගේ අනන්‍යතාවය පිළිබඳ වෙනත් තොරතුරු ඊට ඇතුළත් වේ."

" "ණය ප්‍රදානය කිරීමේ ආයතනය" යන්නෙන් ණය මත භාණ්ඩ සහ සේවා හෝ උපයෝගිතා සේවා සපයන්නා වූ ද, එම භාණ්ඩ, සේවා සහ උපයෝගීතා ණය මත සැපයීමේදී එය ජාතික ආර්ථිකය කෙරෙහි සිදු කරන බලපෑම සැලකිල්ලට ගෙන මණ්ඩලයේ නිර්දේශය මත මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලබන නියමක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන යම් ආයතනයක් අදහස් වේ;".

(3) "ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව" යන යෙදුමේ අර්ථ, නිරූපණය ඉවත් කිරීමෙන්.

(4) "මුදල් සමාගම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

" " මූල්‍ය කල්බදු ආයතනයක්" යන්නෙන්, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතින් අර්ථානුකූලව වූ මූල්‍ය කල්බදු ආයතනයක් අදහස් වේ;

"මූල්‍ය තොරතුරු "යන්නෙන්, සමාගමක් විසින් හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ (149 වන අධිකාරය) ලියාපදිංචි වූ වෙනත් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන ශේෂ පත්‍රයකින්, ලාභ අලාභ ගිණුමකින්, ආදායම් ප්‍රකාශයකින් සහ වෙනත් ගිණුම්වලින් උපුටා ගනු ලැබුවා වූ ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය වෙත ලියාපදිංචි වූ සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබුවා වූ ද දත්තයන් අදහස් වේ.

"මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ සීමාසහිත ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (ඇප) සමාගමේ මුදල් ඔම්බුඩ්ස්මන්වරයා යන නමින් සංස්ථාපිත මණ්ඩලය යටතේ ධූරය දරන තැනැත්තා අදහස් වේ;

"රක්ෂණ සමාගම" යන්නෙන්, රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ;

"ණය දෙන ආයතනය" යන්නෙන්:-

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඇ) මූල්‍ය සමාගමක්;

(ඈ) මූල්‍ය කල්බදු ආයතනයක්;

(ඉ) කොටස් ප්‍රාග්ධනයෙන් (90%) ක් සියයට අනූවක් ඉහත (අ),(ආ), (ඇ) හෝ (ඈ) ඡේදවල සඳහන් යම් ආයතනයක් සතුව ඇති යම් විශේෂ කාර්ය ආයතනයක්;

(ඊ) ණය සැපයීමේ කාර්යයෙහි නියැලී සිටින්නා වූ ද මූල්‍ය ස්ථාවරය සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශය මත මේ පනතේ කාර්ය සඳහා ණය දෙන ආයතනයක් බවට, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයක්".

(5) "ණය දෙන ආයතනය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(6) "බලපත්‍රලාභී වාණිජ බැංකුවක්" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" "යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව වූ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ;"

(7) "ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව" සහ "ජාතික ඉතිරි කිරීමේ බැංකුව" යන යෙදුම්වල අර්ථ නිරූපණ ඉවත් කිරීමෙන්.

(8) "මහජන බැංකුව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"සහභාගී වන ණය ප්‍රදානය කිරීමේ ආයතනය" යන්නෙන් කාර්යාංශයේ ආශ්‍රිත සාමාජිකයකු වීම සඳහා කාර්යාංශය සමඟ ගිවිසුමකට ඇතුළත් වී ඇති ණය ප්‍රදානය කිරීමේ ආයතනයක් අදහස් වේ;

"විශේෂ කාර්ය ආයතනය" යන්නෙන් සුරැකුම්පත්කරනය කිරීමේ කාර්ය සඳහා සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාර්ය සඳහා පමණක් පිහිටුවනු ලැබුවා වූ ද, භාරයක් ඇතුළු සංස්ථාගත හෝ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් අදහස් වේ;

"අගය එකතුකළ සේවාවන්" යන්නෙන්, ණය සහ මූල්‍ය තොරතුරු ලබා ගැනීමට සුදුසුකම් ලත් ආයතන විසින් අවසරලත් කාර්ය සඳහා ණය සහ මූල්‍ය තොරතුරු භාවිතා කිරීම පහසු කිරීමේ අදහසින් හෝ ණය පිළිබඳ වංචා සහ පැහැර හැරීම් අවම කිරීම් අදහසින් සහ සංඛ්‍යා ලේඛනාත්මක හෝ වෙළෙඳපොළ ප්‍රවනතාවක් ඇති විශ්ලේෂණ වාර්තා සැපයීමේ අදහසින් මේ පනතේ 7අ වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක සඳහන් ආයතනවලින් ලබාගත් තොරතුරු භාවිතා කරමින් අතිරේක තොරතුරු හෝ සංඛ්‍යා ලේඛන ලබාදීම අදහස් වේ".

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.